# ලෝකය දෙකට බෙදෙනවා ඒක ආර්ථිකයට හොඳ නැහැ
P 05

THE CHATHAM STREET JOURNAL
Trust your source. Trust your decisions. https://csj.lk/ 2023 | 10 | 29 Vol: 60



P 07

## රනිල් දැන් වෙනස්




## ශක්තිමත් එක්සත් මහාද්වීපයක් සඳහා ජනපතිගේ දැක්ම
P 10



P 09

## කොට්ටේ මාරු කළාට සුව වෙයිද සෞඛ්‍යය?

# ආර්ථිකය හදන එක යූ.එන්.පී.යේ වැඩක්
P 04



# වෙනස භාරගමු!
P 02

හමාස් සංවිධානය ඊශ්‍රායලයට පහර දුන්නේ අහේතුකව නොවන බවට ප්‍රකාශයක් එක්සත් ජාතින්ගේ සංවිධානයේ මහලේකම්වරයා පසුගියදා ප්‍රකාශ කර තිබිණි. මෙම ප්‍රකාශය සමඟ උරණ වූ ඊශ්‍රායලය එය දැඩිව විවේචනයට ලක් කළේ මහලේකම්වරයා ඉල්ලා අස්විය යුතු බවට ගර්ජනාත්මක ප්‍රකාශයක් සමගිනි.

මහලේකම්වරයාට ඉල්ලා අස්වන ලෙස එක්සත් ජාතින්ගේ සාමජික රටක් මෙලෙස එම සංවිධානය තුළ දීම ප්‍රකාශයට පත් කිරීම ආන්දොලනාත්මක සිදුවීමක් මෙන්ම එක්සත් ජාතින්ගේ සංවිධානයේ පැවැත්මටද අභියෝගයක් එල්ල කිරීමක් ලෙස සැලකිය හැකිය. මේ අතර ඊශ්‍රායලය ගාසා තීරයේ යුධ අපරාධ කරමින් සිටින බවට එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමිසමේ කොමසාරිස්වරිය ද ප්‍රකාශ කර තිබිණි.

කෙසේ නමුත් ඊශ්‍රායලය සහ හමාස් සංවිධානය අතර වන යුද්ධය වලක්වාලීමට එක්සත් ජාතින්ට හැකිව නැත. අවම වශයෙන් ඊශ්‍රායලය ගාසා තීරයට කරන අනුකම්පා විරහිත දරුණු ප්‍රහාරය මඟින් සිවිල් වැසියන් තොග ගණනින් ඝාතනයට ලක්වෙමින් තිබේ. විශේෂයෙන් දැරුවන් තුන් දහසකට වැඩි ගණනක් ඝාතනයට ලක්වන තත්වය තුළ හෝ මෙම මලේච්ඡ ප්‍රහාරය වැලක්වීමට එක්සත් ජාතින් අසමත්ව තිබේ. එක්සත් ජාතින්ගේ සංවිධානය ගොඩනගනු ලැබුවේ දෙවන ලෝක යුද්ධයත් සමඟ ඇතිවූ තත්වයන් තුළය. යළි ලෝක යුද්ධයක් ඇති වීම P 02



## දෙසිය විසිපහටම ඉල්ලා අස්වෙන්න හිතෙන පනතක්
P 02

## රුපියල් 20000ක් ඇද්ද? වෙන මොනවත් එපාද?
P 06



PiX by - Rangana Kumara

# මචං නිරූපා

කප්පරක් මතවාද විප්‍රකාරව ඔඩුදුවන සමාජ දේහයක, ගැහැනිය යනු තවත් එක් පිඩාකාරී මූදක පිහිනීමක යෙදෙන්නියකි. මේ වන විට අප පිරිමි මූලික සමාජ දේහය කඩා බිඳ දැමිය යුතු කාලය ඕනෑවටත් වඩා පසු කොට හමාරය. එහෙත් දියුණු යැයි සම්මත කොටගත් විවිධ මාතෘකාවන්හිදී වේදිකා කුඩු පට්ටම් වෙන්නට විලාප දෙන වීරයෝ ගෑනු යන මාතෘකාවේදී පට්ට පටු සීමාවක හිර වන්නේය.

ඔව්, මේ මාතෘකාව සාම්ප්‍රදායික ගෝත්‍රික මාතෘකාවකි. ගැහැනියට සමතැන, කාන්තා අයිතීන්, මේ සියල්ල ගොඩ නැගී අත්තේම එකී සාම්ප්‍රදායිකත්වයේ දිගුවන් ලෙසය.

ඉතිං මේ ගැන දොඩමළුවක් පසුගියදා සිදු වූයේ ChathamTV Youtube චැනලයේ විකාශනය වන "මචං" වැඩසටහනේදීය. ඒ සඳහා ශානුක කරුණාරත්න සමඟ නීතිඥ නිරූපා සේරසිංහ සහභාගී විය. ඇය වෙනස් කළ යුතු සමාජය ගැන කළ සංවාදය ශ්‍රව්‍ය දෘෂ්‍යව නැරඹීමට පහත යොමුවෙන් පිවිසීමට ඔබට ආරාධනා කරමු.

චැතම් ස්ට්‍රීට් යූ ටියුබ් නාලිකාව වෙනුවෙන් කළ "මචං" වැඩසටහනේ පසුගිය කොටස් නැරඹීමට මෙම QR කේතය Touch හෝ Scan කරන්න

# වෙනස භාරගමු!

හමාස් සංවිධානය ඊශ්‍රායලයට පහර දුන්නේ අහේතුකව නොවන බවට ප්‍රකාශයක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා පසුගියදා ප්‍රකාශ කර තිබිණි. මෙම ප්‍රකාශය සමග උරණ වූ ඊශ්‍රායලය එය දැඩිව විවේචනයට ලක් කළේ මහලේකම්වරයා ඉල්ලා අස්විය යුතු බවට ගර්ජනාත්මක ප්‍රකාශයක් සමඟිනි.

මහලේකම්වරයාට ඉල්ලා අස්වන ලෙස එක්සත් ජාතීන්ගේ සාමජික රටක් මෙලෙස එම සංවිධානය තුළ දීම ප්‍රකාශයට පත් කිරීම ආන්දෝලනාත්මක සිදුවීමක් මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පැවැත්මටද අභියෝගයක් එල්ල කිරීමක් ලෙස සැලකිය හැකිය. මේ අතර ඊශ්‍රායලය ගාසා තීරයේ යුධ අපරාධ කරමින් සිටින බවට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ කොමසාරිස්වරියද ප්‍රකාශ කර තිබිණි.

කෙසේ නමුත් ඊශ්‍රායලය සහ හමාස් සංවිධානය අතර වන යුද්ධය වලක්වාලීමට එක්සත් ජාතීන්ට හැකිව නැත. අවම වශයෙන් ඊශ්‍රායලය ගාසා තීරයට කරන අනුකම්පා විරහිත දරුණු ප්‍රහාරය මඟින් සිවිල් වැසියන් තොග ගණනින් ඝාතනයට ලක්වෙමින් තිබේ. විශේෂයෙන් දැරුවන් තුන් දහසකට වැඩි ගනක් ඝාතනයට ලක්වන තත්වය තුළ හෝ මෙම මලේච්ඡ ප්‍රහාරය වැලක්වීමට එක්සත් ජාතීන් අසමත්ව තිබේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය ගොඩනගනු ලැබුවේ දෙවන ලෝක යුද්ධයත් සමඟ ඇතිවූ තත්වයන් තුළය. යළි ලෝක යුද්ධයක් ඇති වීම වලක්වා ලෝක සාමය පිහිටුවීම මෙහි ප්‍රධාන අරමුණක් විය. මෙම සංවිධානයට පෙර තිබූ විශාලම ජාත්‍යන්තර සංවිධානය වූ ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි කිරීමට එදා ලෝක නායකයන් තීරණය කර තිබිණි. කෙසේ නමුත් දශක හත අටක් තිස්සේ මෙම සංවිධානය ලෝක යුද්ධයක් වීම වලක්වා ගැනීමට යම් දායකත්වයක් කර තිබුණත් ලෝකයේ සාමය ආරක්ෂා කර ගැනීමේදී එතරම් සාර්ථක වූයේ නැත. අද වන විට ලෝක පරිමාණයේ වෙළඳ යුද්ධයක් ඇතිව තිබේ. භූ-දේශපාලනික ගැටුම් උග්‍ර වී ඇත. ඒ අතර රුසියාව යුක්‍රේනය ආක්‍රමණය කරමින් ලෝකය ව්‍යාකූල කරන තැනට වැඩ සිදුවන විට අද ඊශ්‍රායල් හමාස් යුද්ධය එම බෙදීම තිව්‍ර කර ලෝකය දෙකඩ කිරීමට සමත්ව ඇත.


එමෙන්ම බලවත් රාජ්‍ය විසින් සාමය පිහිටුවීමට වඩා යුද්ධය අවුළුවාලීමට උල්පන්දම් දෙන ක්‍රියාකාරිත්වයක නියැලෙමින් සිටීම බරපතල කරුණකි. එසේම මෙම දෙරට යුද්ධය අතරට පැමිණ කලාපීය යුද්ධයක් ඇවිළවීමට කැසකවන බවද පෙනෙන්නට තිබේ. මේ තත්වයන් හමුවේ එයට එරෙහිව අනෙක් රටක් යුධ ප්‍රකාශ කරන තැනට වැටුණහොත් තත්වයන් පාලනය වීමට තිබූ සියළු ඉඩකඩ ඇහිරෙනු ඇත. කෙසේ නමුත් මෙතක් තුන්වන ලෝක යුද්ධයක් ඇති නොවුණත් එය අද හෙටම ඇතිවිය හැකි අවදානම තිබේ. මේ අනුව ජාත්‍යන්තර සංවිධානයන් මීට විසඳුම් සෙවීමෙහි අසමත් වීම පැරණි ලෝකයේ කඩා වැටීමේ ආරම්භය සනිටුහන් කරවන්නකි.

ලෝකය අලුත් විය යුතු බවට වෙනස් විය යුතු බවට හඬක් නැගෙමින් තිබුණේ මේ යුද ගැටුම්වලට පෙර සිටමය. ඒ අනුව නව ලෝක පිළිවෙතක් අනුව ලෝකය යළි හැඩ ගැසීම විය යුතු වීමේ වුවමණාව මේ වන විට දැඩිව මතු වෙමින් තිබේ. නමුත් මේ වුවමණාව අද ප්‍රධාන වශයෙන් පෙන්නුම් කරමින් සිටින්නේ නැගී එන නව ආර්ථික බලවතුන්ගේ කලාපය වන ආසියානු රාජ්‍යයන් සමූහය වෙතිනි. විශේෂයෙන් චීනය සහ ඉන්දියාව වෙන් වෙන්ව හෝ ඒකාබද්ධව හෝ පෙරටු කරගත් ඒකරාශී වීම් සිදුවෙමින් තිබේ. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාත් ජාත්‍යන්තරය හමුවේ නිරන්තරයෙන් හඬ නැගුවේ මේ වෙනුවෙනි. පැරණි ලෝක පිළිවෙත අදට නොගැලපෙන අසාර්ථක එකක් බවත් එය වෙනස් විය යුතු බවත් ඔහු එක්සත් ජාතීන් හමුවේත් පැවැසීය. නමුත් මැදපෙරදිග යුද තත්වය බලාපොරොත්තු වූවක් නොවීම මත සාමකාමී වෙනස් වීමකට තිබුණ ඉඩකඩද දැන් ඇහිරෙමින් තිබේ. නමුත් වෙනස් වීම කවර ලෙසකින් හෝ වීම සිදුවෙනු ඇත. වෙනස් වෙමින් අලුත් වෙමින් නව ගමනකට මුලපුරමින් සිටින ශ්‍රී ලංකාව දැන් මෙම ලෝක පිළිවෙතෙහි හදිසි වෙනස් වීමත් භාරගැනීමට සූදානම් විය යුතුය. නමුත් එය වඩා දුෂ්කරතාවලින් බහුල කාලයක් වීම නොවැලැක්විය හැකිය.

CHATHAM STREET JOURNAL



# දෙසිය විසිපහටම ඉල්ලා අස්වෙන්න හිතෙන පනතක්



**"රට හදන්න යන්න කලින් තමන් හැදිල හිටපන්"** යනුවෙන් මාපියන් තමන්ගේ තරුණ දරුවන්ට කියන අවස්ථා ඇත. ඒ සමාජ වැඩ, දේශපාලන කටයුතු ආදියට සම්බන්ධ වන රැඩිකල් අදහස් ඇති නැතිනම් නාහෙට නාහන දරුවන් ඇති දරුවන්ගේ මාපියන්ය. සමහර විට මාපියන් අපේක්ෂා කරනවා ඇත්තේ හොඳ චරිතවත් ගුණ යහපත්කම් සහිතව, හොඳ අධ්‍යාපනයක් සහිතව, හොඳ රැකියාවක් ආදායම් මාර්ගයක් සහිතව තමන් ස්ථාවර වී දියුණු වී අනෙක් වැඩ ගැන බැලීම විය යුතුය කියන එකය. කොහොම වුණත් ආදර්ශයෙන් පෙන්විය හැකි ගුණාංග නොමැතිව වෙන වැඩ කරන්න යෑම අවුල් සහගත වැඩකි.

මේ රටේ දේශපාලන ක්ෂේත්‍රය තුළත් අද දකින්නට ලැබෙන්නේ එහෙම ආදර්ශයක් විය හැකි ගුණාත්මක දේශපාලන චරිත නොවේ. දූෂණ වංචාවන්ට අපරාධ චෝදනාවන්ට හසුනොවූ මහජන නියෝජිතයන් සොයා ගැනීම පහසු නැත. මහජන දේපොළ සහ මුදල් පෞද්ගලික පරිහරණය වෙනුවෙන් යුතු හෝ අයුතු ලෙස යොදා නොගත් කිසිවකුත් පාර්ලිමේන්තුව තුළ සිටිනවා ද යන්නත් සැක සහිතය. මීට සතියකට දෙකකට පෙරත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක් සහ මන්ත්‍රීවරයකු අතර ගුටි කෙළියක් දකින්නට ලැබිණි. සභාගර්භය තුළදීම ලිංගිකමය අපහාස කිරීම අසභ්‍යය භාෂාවෙන් කෙරෙන කෑකෝ ගැසීමද නිරන්තරව දකින්නට ලැබෙන්නකි. ඒ තබා රටේ වැදගත් කරුණක් සම්බන්ධයෙන් වන විවාදයකදී වුවත් බොහෝ මන්ත්‍රීවරුන් කටයුතු කරන්නේ අදාල වැදගත් කරුණ පසෙකලා වෙන වෙන වල්පල් දෙඩවීමය. බොහෝ දෙනෙකුට අදාල විෂය අවබෝධයත් නැත. හරියට සංඛ්‍යාවක් පවසා ගැනීමටවත් නොහැකි අයවලුන් සිටී. පට්ටපල් බොරු කියමින් රටම නොමඟ යවන වුන්ද සිටී. එකිනෙකාට මඩ අවලාද අපහාස කරගැනීම් එදිනෙදා චර්යාවේ කොටස් වී ඇත. කොටින්ම දැන් පාර්ලිමේන්තුව සජීවීව විකාශය වුවත් ඒවායේ අසන්නට දෙයක් නැති තරම්ය. හර බර, බුද්ධියට ආමන්ත්‍රණය කරන දේශපාලනික අධ්‍යාපනික වටිනාකම් සහිත දේශන නැති තරම්ය.

මීට දශක ගණනාවකට පෙර පාර්ලිමේන්තුව යනු උගත් බුද්ධිමත් විෂය ප්‍රවීණයන්ගේ හෝ අවංක මහජන නියෝජිතයන්ගේ බුද්ධි මණ්ඩලයක් වැනි තැනකි. එකල හැන්සාඩ් වාර්තා කියවීම රට ලෝකය ගැන දැනුමේ නිම් වළලු පුළුල් කිරීමට තරම් අධ්‍යයනයකි. එහෙත් දැන් ඇත්තේ වල්පල්ය. පාර්ලිමේන්තුවට අද පාර්ලිමේන්තුවේ විනය, හැදියාව, ශීලාචාරකම හෝ සකසා ගැනීමේදීත් අසමත්ය.

මේ තත්වයන් මත දැන් රට හදන තැන නැතිනම් පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන්ට කියන්න සිදුව ඇත්තේ රට හදන්න කලින් තමන් හැදිලා පෙන්වාපන් යන්නය. 225ම එපා යනුවෙන් ජනතාවගේ පරිභවයට මේ අය පාත්‍ර වුයේත් මේ අවුල නිසාය. කොහොම නමුත් මේ මහජන නියෝජිතයකු කියන්නේ කාටද ඔහුගේ හෝ ඇයගේ කාර්යභාරය වගකීම විය යුතු කුමක්ද යන්න ගැන උගන්වන්න, ඔවුන්ව පාලනය කරන්න පාර්ලිමේන්තුවට ඉහළින් වෙනම නෛතික බලයක් සහිත ස්වාධීන ආයතනයක් පිහිටුවීමට විය යුතු බවට ජනාධිපතිවරයා කල්පනා කර තිබුණේ මීට බොහෝ කලකට පෙරය. මේ අනුව මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම වෙනුවෙන් ජනාධිපතිවරයා පත්කර තිබෙන නව කොමිසමේ කාර්යභාරයක් ලෙසද මන්ත්‍රීවරුන්ට ආචාරධර්ම පද්ධතියක් සැකසීමත් අඩංගු කර තිබිණි. එසේම පසුගියදා අගමැති දිනේෂ් ගුණවර්ධන සහ අධිකරණ ඇමැති විජේදාස රාජපක්ෂ කැබිනට් මණ්ඩලයට නව පනත් කෙටුම්පතක් යෝජනාව ගෙනවිත් තිබිණි. කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය නිවේදනය තුළ ඒ සම්බන්ධයෙන් දැනුම් දී තිබුණේ මෙසේය.

## ස්වාධීන පාර්ලිමේන්තු ප්‍රමිති අධිකාරියක් ස්ථාපිත කිරීම

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වගවීම, විශ්වාසනීයත්වය, පැහැදිලිභාවය සහ වෘත්තීයභාවය පිළිබඳව සහතික වීම ව්‍යවස්ථාදායකයේ සඵලත්වය, විනිවිදභාවය සහ සාධාරණත්වය පිළිබඳව මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය සාධකයන් වේ.**

**එබැවින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සෑම අවස්ථාවකදීම තම බලතල, වරප්‍රසාද, කාර්යයන් සහ කර්තව්‍යයන් විශ්වාසවන්තභාවයෙන් සහ අවංකභාවයෙන් යුතුව ක්‍රියාවේ යෙදවිය යුතුව ඇත. ලෝකයේ බොහෝ රටවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වූ චර්යාධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ එම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් පවතින බව සැලකිල්ලට ගනිමින් මෙරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ද චර්යාධර්ම සංග්‍රහයක් සම්පාදනය කිරීම සහ ඒ පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ස්වාධීන ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ.**

**ඒ අනුව, එම කාර්යය සඳහා සකස් කරනු ලැබ ඇති මූලික කෙටුම්පත පිළිබඳව පාර්ලිමේන්තුවේ ගරු කතානායකතුමාගේ සහ සියලුම පක්ෂ නායකයින්ගේ අදහස් ලබා ගැනීමටත්, ඉන් අනතුරුව එකී අදහස් ද සැලකිල්ලට ගනිමින් පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමටත් ගරු අග්‍රාමාත්‍යතුමා සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඒකාබද්ධව ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.**

මේ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ආණ්ඩු මට්ටු කිරීම සඳහා ගෙන එන්න යන නව නීතිය ගැන අදහසක් ලැබිය හැකිය. මීට විරුද්ධ වීමට කිසිවකුට නොහැකිය. මේ විය යුතුම දෙයකි. එසේම එක අතකින් පාර්ලිමේන්තුවටම සම්මත කිරීමට සිදුවන මේ යෝජනාව ගැන මන්ත්‍රීවරුන් ලැජ්ජා විය යුතුය. ඒ රටට ආදර්ශයක් විය යුතු තමන්ගේ චර්යාව වැටී ඇති තුච්ඡ නින්දිත බව මෙමඟින් ප්‍රකාශමාන වෙන නිසාය. ඒත් මේ මන්ත්‍රීවරුන් යනු ලැජ්ජා නහර කපා දැමූ පිරිසක් වන බවද අමතක නොකළ යුතුය.

ඒ කොහොම නමුත් මේ තත්වයන් මේ රටට පමණක් පොදු වූවක් නොවේ. මහජන නියෝජිතයකු යනු මහජනතාව විසින් සිය කැමැත්තෙන් පත්කර එවනු ලබන්නෙකි. ඒ නිසා මේ නියෝජනය වන්නේ තත්කාලීන සමාජ ස්වරූපයමය. නමුත් මේ නියෝජිත ගොනුවේ අරමුණ සමාජය පවතින ලෙසින් පවත්වාගෙන යෑම නොවේ. වැරදි අඩුපාඩු සකසාගෙන සංවර්ධනයේ දිශාවට ගෙන යෑමය. සමස්තයක් ලෙස දියුණුවක් අත්පත්කර ගැනීමය. නමුත් මෙහිදී අඩුම තරමින් මහජන නියෝජනයක් ලෙස එම වගකීම දරන්නා මේ ඉදිරිගාමී වෙනස්වීම වෙනුවෙන් ආදර්ශමත් චරිතයක්වීම විය යුතුය. තමන් මොන හොරෙක් පාර්ලිමේන්තුවට පත්කර එව්වත්, ඒකා හොරකමේ යනවා දකින්න මහජනතාව අපේක්ෂා කරන්නේ නැත. මහජනතාව බලපොරොත්තු වන්නේ තමන්ගේ ප්‍රශ්නය විසඳාගැනීමට තමන්ගේ නියෝජිතයාගේ ශිෂ්ඨසම්පන්න මැදිහත් වීමය.

මහජන නියෝජිතයකුට ජනතා වරමෙන් ලැබෙන බලය අයුතු ලෙස පාවිච්චි කිරීම වැලැක්වීමට, මහජන මුදල් දේපොළ රැකීමට හා වෙනත් අපරාධ වැලැක්වීමට ආදිය වෙනුවෙන් රටේ යම් යම් නීති ප්‍රතිපාදන තිබුණත් දේශපාලන බලය, මන්ත්‍රී වරප්‍රසාද නිසා නීතියට යටත් නොවී වටවංගු ගැසීමේ හැකියාවත් මන්ත්‍රීවරුන්ට තිබේ. මෙවැනි තත්වයක් ලෝකය පුරාම දකින්නට ලැබෙන නමුත් ඒවා වැලැක්වීම වෙනුවෙන් ගත් විශේෂ නෛතික ක්‍රියාමාර්ගයන්ද බොහෝ රටවල මේ වන විට ක්‍රියාත්මකව ඇත.

කැබිනට් මණ්ඩලයට යෝජනා කර තිබෙන **'ස්වාධීන පාර්ලිමේන්තු ප්‍රමිති අධිකාරිය'** (IPSA) වැනි ආයතන බොහෝ රටවල ක්‍රියාත්මකව පවතී. මෙම නමින්ම මහා බ්‍රිතාන්‍යයෙත් ආයතනයක් ස්ථාපිත කර ඇත. (බ්‍රිතාන්‍යයේ මෙම ආයතනය ගැන සියළුම තොරතුරු https://www.theipsa.org.uk/ වෙබ් අඩවියට පිවිසීමෙන් දැනගත හැකිය) එය 2009 වසරේ හඳුන්වාදෙනු ලැබුවකි. එහි අනෙක් අදහස නම් මෙරට ක්‍රියාත්මක වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදායේ නිර්මාර්තෘවරුන් වූ මහ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව තුළත් ඊට නොගැලපෙන චර්යාවන් සහිත මන්ත්‍රීවරු ක්‍රියාත්මක වී ඇති බවය. ඒ කොහොම නමුත් බ්‍රිතාන්‍ය ප්‍රමිති අධිකාරිය මඟින් ඒ ගැටළුව ජයගෙන ඇත්තේ අතිශය දැඩි නෛතික ප්‍රතිපාදන රැසක් පැනවීමෙන් බව කිව යුතුය.

මේ ආකාරයේම පනතක් මෙරට ස්ථාපිත වන්නේද නැද්ද යන්න අවිනිශ්චිතය. දැනට ඉදිරිපත් කර ඇති මූලික යෝජනාව ගැනද තොරතුරු අනාවරණය නොවෙතත් මහජන නියෝජිතයා යනු කවරෙක් විය යුතුද යන්න ගැන බ්‍රිතාන්‍යය දෙන ආදර්ශය අතිශය වැදගත්ය. ඇතැම් විට මෙරට පනත් කෙටුම්පතට, බ්‍රිතාන්‍ය පනතම අදාල කරගතහොත් මන්ත්‍රීවරුන්ගේ මානව හිමිකම් කඩන, ප්‍රජාතන්ත්‍ර විරෝධී මර්දනකාරී පනතක් ලෙස එයට විරෝධය පෑම මන්ත්‍රීවරුන් වෙතින්ම සිදුවීමේ ඉතා ඉහළ ඉඩකඩක් ඇති බවත් සැකයක් නැතිව පැවැසිය හැකිය. මන්ද එය එතරම්ම මන්ත්‍රීවරුන්ගේ හැසිරීම් පාලනයකර තිබෙන නිසාය. කොටින්ම මෙහිදී මහජන නියෝජිතයා, මහජන සේවකයා වෙනුවට මහජනතාවගේ වහලෙක් බවට මන්ත්‍රීවරයා පත්කර ඇතැයි කිව්වත් වැරදි නැත. ඒ ආකාරයේ පනතක් මෙරටටත් වේ නම් වර්තමාන මන්ත්‍රීවරු අති බහුතරය තවදුරටත් පාර්ලිමේන්තු නියෝජනයට හෝ කැමැති නොවනු ඇත. මන්ද ඒ හරහා පුද්ගලික ප්‍රතිලාභ ලැබීම මුළුමනින්ම වලකා ඇති බැවිනි. කෙසේ නමුත් මෙම පනත සම්බන්ධයෙන් මෙරට ජනතාවට අවබෝධයක් තිබීම සැබෑ මහජන නියෝජිතයා යනු කවරෙක් ද යන්න තේරුම් ගැනීමටවත් ප්‍රමාණවත් වෙනු ඇත.

මෙම බ්‍රිතාන්‍ය පනත අනුව පනවා ඇති මන්ත්‍රී තහංචි ගැන කෙටියෙන් සඳහන් කළහොත් 2010 වසරේ සිටම බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැටුප් දීමනා ආදිය අඩු වැඩිවීම තීරණය කරනු ලබන්නේ ස්වාධීන පාර්ලිමේන්තු ප්‍රමිති අධිකාරිය විසිනි. පාර්ලිමේන්තුවට තමන්ගේ වැටුප්, ඉන්ධන දීමනා වරප්‍රසාද ආදිය තීරණය කළ නොහැක. මුළුමනින්ම අගමැති, ඇමැති, ඇතුළු මන්ත්‍රීවරුන් 650 දෙනෙකුගේ සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලයේ වැටුප් සහ විශ්‍රාම වැටුප්, රාජකාරී වියදම් නියාමනය සහ පරිපාලනය ප්‍රමිති අධිකාරිය විසින් තීරණය කිරීම සිදුකරයි.

එමෙන්ම මහජනතාවටද, මෙම ප්‍රමිති අධිකාරිය විසින් ලබා දී ඇති ප්‍රතිපාදන සහ පහසුකම් පිළිබඳව සහ ඒ අනුව මන්ත්‍රීවරු කටයුතු කර ඇත්තේ කෙසේද යන්න සොයා බැලීමේ අයිතිය සහ පහසුකම් සපයා ඇත. මේ අනුව මහජන මුදල් නිසි ලෙස වියදම් කිරීම සහතික කිරීමට මෙම අයතනය බැඳී සිටී.

කෙසේ නමුත් මන්ත්‍රීවරුන්ට වැටුපට අමතරව හිමි වන්නේ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීමේදී දරන වියදම් සඳහා පමණි. පෞද්ගලික භාවිතයට එය වැය කළ නොහැක. එනම් රාජකාරී වියදම් මන්ත්‍රීවරුන්ගේ වැටුප් වැඩි කිරීමට අදාල ප්‍රසාද දීමනාවක් ලෙස නොලැබේ. ඒ අනුව ලබා දෙන සෑම බ්‍රිතාන්‍ය පවුමකටම අදාල වියදම් සහතික කිරීම මන්ත්‍රීවරයා කළ යුතුය.

බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ලන්ඩන් නුවර හෝ තමන්ගේ මැතිවරණ කොට්ඨාසයේ ජීවත් වීම සඳහා නිවසක් කුලියට ගැනීමට වන වියදම් ලබාදීම සහ ඊට දුරකතන ආදී පහසුකම් සපයනු ලබයි. සෑම මන්ත්‍රීවරයෙකු වාර්ෂික තැපැල් දීමනාවකටද හිමිකම් කියයි. ඊට අමතරව එම නිවස හා පාර්ලිමේන්තුව අතර ගමන් කිරීමට වන වියදම්ද ලබාදීම වන නමුත් නියමිත මාර්ගය පමණක් පාවිච්චි කළ යුතුය. එසේම සිය ඡන්ද කොට්ඨාසයේ ගමන් කිරීමට වන වියදම ලබාදීම සිදු කරන අතර එය සිදුවිය යුත්තේද අදාල සීමාව තුළ පමණි. එයින් පිටත වන වියදම් පෞද්ගලිකව දැරිය යුතුය. එසේම මන්ත්‍රීවරුන්ට ඔවුන්ගේ සාමාන්‍ය වැඩ කරන දිනවලදී ආහාර පාන වැනි පුද්ගලික වියදම් සඳහා හිමිකම් පෑමට නොහැකිය. තවද පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයට අමතරව වෙනත් ඇමැති ආදී තනතුරු වෙනුවෙන් වෙනම වැටුප් හා වරප්‍රසාද හිමිව තිබේ. කොහොම නමුත් ලැබෙන දේ ලැබෙන්නේ කාර්යක්ෂමව කටයුතු සිදුකිරීමේ සහ මහජන මුදල් නාස්ති නොවන ලෙස පාලනයක් යටතේය.

මේ ආදී වශයෙන් මහජන මුදල් අවභාවිතාව වැලැක්වීම වෙනුවෙන් නිතී ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් මෙම ආයතනය විසින් පනවා ඇත. මන්ත්‍රීවරයකු ලෙස හිමිකම් පෑමේදී, මන්ත්‍රීවරුන් අනුගමනය කළ යුතු සමාජ ජීවිතය සම්බන්ධයෙන් මූලධර්ම හඳුන්වා දී ඇති අතර ඒ අනුව වන මන්ත්‍රීවරුන්ගේ චර්යාධර්ම සංග්‍රහයට අනුගත වීම විය යුතුය. එය කඩ වන්නේ නම් මෙම ප්‍රතිපාදන කප්පාදුවක් හෝ දඬුවමකට යටත් වීමක් හෝ වුව විය හැකිය. මේ අනුව මන්ත්‍රීවරුන් ඉල්ලා සිටින සියලුම මුදල් සඳහා වන ඔවුන්ගේ අයවැය සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීම ආදිය සඳහා නීත්‍යානුකූලව ඔවුන් වගකිව යුතුය.

මෙම අයතනය විසින් ස්වාධීන නියාමකයෙකු ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඔවුන්ගේ පාර්ලිමේන්තු කටයුතු කරගෙන යාමට සුදුසු පරිදි සම්පත් ලබා දීම සහ සුදුසුකම් ලත් හිමිකම් පෑමට ඔවුන්ට සහාය වීම සිදුකරන අතර ඒ සඳහා වන ප්‍රතිපත්ති මාලාවක්ද ඇත. සෑම මන්ත්‍රීවරයකුටම සමාන සහ සාධාරණ ලෙස සලකන අතර, කිසිවකුට අයථා අවාසියක් හෝ වාසියක් නොලැබේ. මන්ත්‍රීවරුන්ගේ වියදම් පිළිබඳ තොරතුරු මහජනතාවට දැන ගැනීමේ පහසුකම සැලසීම මඟින් විනිවිදභාවය ද තහවුරු කරයි.

බ්‍රිතාන්‍ය වැනි දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටවල මැති ඇමැතිවරුන් දුම්රියේ, බස් රථයේ, සාමාන්‍ය කඩපොළේ දකින්නට ලැබෙන්නේ මෙවැනි පාලන කිරීම් හරහා ඔවුන්ද සාමාන්‍ය මිනිසුන් බවට පත් කිරීම නිසාය. විශේෂ වරප්‍රසාද භුක්ති විඳීමේ අවස්ථාවක් ඔවුන්ට දී නැත.

මෙරට සම්බන්ධයෙන් සිතා බැලුවහොත් බොහෝ විට ප්‍රදේශීය සභා මන්ත්‍රීවරයා පවා සිටින්නේ පොදු සමාජයට ඉහළින් සිටින වරප්‍රසාදිත ප්‍රභූ පැලැන්තියක් නියෝජනය කරන්නාක් මෙනි. එසේම විවිධ ජාවාරම්වල යෙදෙමින්, මහජන මුදල් දේපොළ අවභාවිතා කරමින් යහමින් වැජඹෙන්නකි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීම එම තත්වයන් වර්ධනය කරන අතර ඇමැති ධුරයක් යනු එහි උත්සන්නම අවස්ථාවකි. මේ තත්වයන් යටතේ 'ස්වාධීන පාර්ලිමේන්තු ප්‍රමිති අධිකාරිය' වැනි ආයතනයක් පිහිටුවීම මඟින් හෝ මේ දූෂිත සංස්කෘතිය අහෝසි කිරීම විය යුතුවීම යුගයේ බරපතල වුවමණාවකි. වත්මන් ජනාධිපතිවරයා එයට මූලික වී කටයුතු සම්පාදනය කිරීම, මේ රටේ සබුද්ධික පොදු ජනතාව අපේක්ෂා කරන දියුණු දේශපාලනික සංස්කෘතිය පිළිබඳ සිහිනය යථාර්ථයක් කිරීමකි.

සෝෂක

# ආර්ථිකය හදන එක යූ.එන්.පි.යේ වැඩක්



**"යූ.එන්.පි.කාරයෝ ආඩම්බර ජාතියක්, ණය වෙලා ඉන්න කැමැති නැහැ. හම්බකරලා ණය ඔක්කොම ගෙවනවා."** එක්සත් ජාතික පක්ෂයේ 77 වන සම්මේලනය අමතා ජනාධිපති රනිල් වික්‍රමසිංහ එසේ කියන්නේ එ.ජා.ප. නායකයා ලෙස තම පාක්ෂිකයින්ගේ අභිමානයටද ගෞරවයක් කරමින්ය. සම්මේලන කතාවේ දී 2022 රට වැටී තිබුණ අවස්ථාවේ ආර්ථිකය ගොඩදාන්න ආණ්ඩුව භාරගන්න කියාලා කියනකොට, 'මට සහය දෙනවා නම් මම භාරගන්නම් ඒක කරන්න පුළුවන්' කියලා භාරගත්තේ ආර්ථිකය හදන එක යූ.එන්.පි.යේ වැඩක් වගේම ඒක කරන්න පුළුවන් දෙයක් කියලා දන්න නිසයි යනුවෙන්ද ඔහු පැවැසීය.

## උඩු ගං බලා යාම

තමන් ආණ්ඩුව භාරගන්නා විට ලංකා ආණ්ඩුවට ඩොලර් 200ක් වත් තිබුණේ නැති වුණත්, මේ වන විට ඩොලර් මිලියන 3,500ක විදේශ සංචිත ඇති බව ජනාධිපතිවරයා පෙන්වා දුන්නේ, මේ වනවිට ආර්ථිකය අත්පත් කරගෙන ඇති ජයග්‍රහණද පෙන්වා දෙමින්ය. පසුගිය වසරේ ඔහු ආණ්ඩුව භාරගන්නා විට තෙල් නැව් ඇවිත් මුහුදේ නැංගුරම්ලාගෙන සිටියේ තෙල් ටික ගොඩබෑමට අවශ්‍ය ගෙවීමට ඩොලර් නැති නිසාය. නමුත් අද වන විට වාහන හැර අන් සියළු භාණ්ඩ ගෙන්වීමට පැවැති ආනයන සීමා ඉවත් කර ඇත. රනිල් වික්‍රමසිංහට ආණ්ඩු කරන්න ලැබෙන අවස්ථාවලදී සිදුවන්නේම වැටුණ තැනින් රට ඔසවා තැබීමට උඩු ගං බලා යාමටය.

ආණ්ඩු කිරීමේදී පහසු පරිසරියක ආණ්ඩුව පවත්වාගෙන යාම හෝ වඩා අර්බුදකාරී තත්වයක ආණ්ඩුව පවත්වාගෙන යාමට පාලකයින්ට සිදුවේ. සාපේක්ෂව පහසු පරිසරයක ආණ්ඩු කිරීමේදී ජනතාවගේ ඕනෑ එපාකම් සැපිරීමට හැකි නිසා ආණ්ඩුවට එරෙහිව විශාල ජන පීඩනයක් එල්ල වන්නේ නැත. එමෙන්ම ජනතාවට යම් ආකාරයක ආර්ථික සහන දීමටද පුළුවන. එය ආණ්ඩුවේ සෞඛ්‍යයට යහපත් නිසා නැවත ජනවරමක් ගැනීමද අපහසු නොවන්නේය.

## ජනාධිපතිවරයා ඝාතනය වූ ආණ්ඩුවක් අගමැතිවීම

රනිල් වික්‍රමසිංහ මුලින්ම පාර්ලිමේන්තු පැමිණි 1977දී පිහිටවූ ආණ්ඩුව පාර්ලිමේන්තුවේ හයෙන් පහක අති විශාල බලයක් සහිත ආණ්ඩුවකි. එම ආණ්ඩුවට 83 ජූලි කලබල සමඟ උස්සන්න වූ උතුරේ සිවිල් යුධ තත්වය හැරෙන්නට බරපතල අර්බුද ඇතිවන්නේ 80 දශකයේ අවසානය වන විටය. ඒ දකුණේ තරුණ කැරැල්ල නිසාය. 1988 - 89 අතර නැවත පිහිටුවන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යනු අතිශය අපහසු පරිසරයක පිහිටවූ ආණ්ඩුවකි. එය අවසාන වන්නේ ජනාධිපතිවරයාද ඝාතනය කිරීමට තරම් අර්බුදයන් තීව්‍ර වන තත්ත්වයකට වර්ධනය වීමත් සමඟය. මේ අවස්ථාව වන විට රනිල් වික්‍රමසිංහ මහතාට පැවරෙන්නේ බරපතල වගකීමකි. රටේ ජනාධිපතිවරයාද ඝාතනය වී ඇති අවස්ථාවේ ආණ්ඩුව පවත්වාගෙන යාමය. උතුරේ යුද තත්වයක් සමඟ එජාපයේ නායකයින් එකා පිට එකා ඝාතනය වෙද්දි ජනාධිපති ඩී.බී. විජේතුංග සමඟ රනිල් වික්‍රමසිංහ අග්‍රමාත්‍යවරයා ලෙස පක්ෂය පවත්වාගෙන ගියත් අවසානයේ එජාපයේ මීළඟ ජනාධිපති අපේක්ෂකයා වූ ගාමිණී දිසානායක මහතා ද ඝාතනය විය.

## ඍණ ආර්ථිකයක් සහිත රටක අගමැතිවීම

මෙම තත්ත්වය හමුවේ 1994 දී බලය ගන්නා පොදුජන එක්සත් පෙරමුණ ආණ්ඩුවට ආරම්භයේ පැවැති තත්වයට සාපේක්ෂව පහසු වුවද, 1990 දශකයේ අවසාන භාගය වන විට පාලනය අර්බුදකාරී තත්වයන් මතුවිය. දෙවන වතාවටද රාජ්‍ය නායකයා ඝාතනය කිරීමේ උත්සහයක යෙදීමට තරම් ශක්තිමත් ලෙස උතුරේ යුද තත්වය වර්ධනය වී පැවැතියේය. එලෙස චන්ද්‍රිකා ජනාධිපතිනියගේ ආණ්ඩුවේ පාලනය කොපමණ දුරට බිඳ වැටී පැවැතියේද කිවහොත් රටේ ආර්ථිකයේ වර්ධන වේගය ඉතිහාසයේ ප්‍රථම වතාවට ඍණ අගයකට කඩා වැටුණි. එනම් 2001 දී රටේ ආර්ථික වර්ධන වේගය ඍණ 1.5කි.

2001 දී චන්ද්‍රිකා ජනාධිපතිනියගේ ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ බලය ගන්නේ නැවත එජාපයයි. එය පහසු සමාජ ආර්ථික දේශපාලන පරිසරයක බලය ගත් අවස්ථාවක් නොවීය. උතුරේ සිවිල් යුද්ධය මෙන්ම රටේම ආර්ථික යුද්ධයද ජය ගැනීමට ආණ්ඩුවේ ආරම්භයේ පටන් ක්‍රියාකිරීමට රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට සිදුවිය. ආණ්ඩුවක් බලයට විත් මුල් මාස කිහිපය නැතිනම් අවුරුද්දක් පමණ කාලය සිය පාක්ෂිකයින්ගේ ඕනෑ එපාකම් ඉටු කිරීමට මෙන්ම ජනතාවට සහන දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගැන උනන්දු වන පූර්ව අත්දැකීම් පැවැතියද, 2001 ආණ්ඩුවට එවැනි තත්වයක් නොවීය. ආණ්ඩුව පත්වූ විගසම රාජ්‍ය වියදම් කප්පාදුවත්, යුද තත්ත්වයට මුහුණදීමට පැවැති අපහසු නිසා සටන් විරාමයකට යාමත් අවශ්‍ය කොන්දේසි විය.

එම ආණ්ඩුවේ තවත් විශේෂත්වයක් වූයේ ජනාධිපතිවරිය ලෙස පො.එ.පෙ. නියෝජනය කරමින් චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියත්, අගමැති ලෙස එ.ජා.පෙ. නියෝජනය කරමින් රනිල් වික්‍රමසිංහ මහතාත් සිටීමය. මෙම තත්වයද පෙරකී අපහසු තත්ත්වයන් යටතේ ආණ්ඩු කිරීමේ අසීරුතාව තවත් තීව්‍ර කිරීමට හේතුවිය. එනම් රට සාමාන්‍ය තත්වයට පත්කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඇති කිරීමේදී විශේෂයෙන්ම සාම ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාමේදී හා අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ කිරීමේදී නව ජනවරමකින් පත්වූ අග්‍රාමාත්‍යවරයාට පැවැති වුවමණාවට ජනාධිපතිවරියගේ පාර්ශ්වයෙන් සාධනීය සහයෝගයක් නොලැබුණු බව ඒ ඉතිහාසය දන්නෝ දනිති.

## උපක්‍රමිකව එල්.ටී.ටී.ඊ.ය දියාරු කිරීම

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවට දේශපාලනිකව ජාත්‍යන්තර සහයෝගය දිනාග ැනීමත්, ලෝකයේ රටවල් රාශියක් ඉදිරිපත් වූ ජපන් ආධාර සමුළුව හරහා ඩොලර් මිලියන 5,000ක් විදේශීය ආධාර ශ්‍රී ලංකාවට දිනාග නිමින් ආර්ථික සහයෝගය දිනාගැනීමත් රනිල් වික්‍රමසිංහ මහතා අග්‍රාමාත්‍යවරයා ලෙස තනිව අත්පත් කරගත් ජයග්‍රහණයන් බව කිව යුතුය. එමෙන්ම පැවැති මූල්‍ය අර්බුදය විසඳා ගැනීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කටයුතු කිරීමේ ප්‍රතිපලයක් ලෙස ඍණ 1.5%ක ආර්ථික වර්ධන වේගය වසරක් තුළ 4% දක්වා ගෙන ඒමටත්, රාජ්‍ය මූල්‍ය කළමණාකරණය සඳහා රාජ්‍ය මූල්‍ය කළමණාකරන (වගකීම්) පනත ගෙන එමින් රට මුහුණ දී ඇති ණය බර පාලනය කිරීමටත්, දේශීය ණය සම්පූර්ණයෙන් මෙන් ගෙවා අවසාන කිරීමටත් 2004 දී ඔහුට ආණ්ඩුව අහිමි කරන අවස්ථාව වන විට හැකිවිය.

ආර්ථික ජයග්‍රහණ අත්කර දීම මෙන්ම පැවැති යුද්ධයේදී එල්.ටී.ටී.ඊ.යට අවාසි වන තත්වයන් ඇතිවූයේද මෙම වකවානුවේය. ජාත්‍යන්තරය සමඟ ක්‍රියාත්මක කරන ලද උපක්‍රමික ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස එල්.ටී.ටී.ඊ. සංවිධානය දෙකඩවීමත්, කරුණා අම්මාන් සංවිධානයෙන් ඉවත් කිරීමට සැලසුම් කිරීමත්, ශ්‍රී ලංකාවට ඇමරිකාවෙන් විශාල යුද නැවක් ඇතුළු ආධාර ලැබීමත් ජාත්‍යන්තරව එල්.ටී.ටී.ඊ. සංවිධානය හුදකලා කිරීමට එම වකවානුවේ ගත් ක්‍රියාමාර්ගයන් විය.

2004 දී පිහිටවූ ආණ්ඩුවට කටයුතු කිරීමට වාසි සහගත තත්වයන් රට තුළ ඇතිවී තිබුණි. එනම් ආර්ථිකයේ ශක්තිමත් තත්වයක පැවැතීමත්, එල්.ටී.ටී.ඊ. සංවිධානය දුර්වලවීමත් එම වාසි සහගත තත්ත්වයන් අතර ප්‍රධාන සාධක ලෙස දැක්විය හැකිය.

## මහින්ද රාජපක්ෂ මිලින්දට කී දේ

හදිසි හා අනවශ්‍ය අර්බුදයක් මවා 2004 මහමැතිවරණයත් 2005 ජනාධිපතිවරණයෙන් රාජපක්ෂ මහතා ජය ගැනීමත් සිදුවන විට රනිල් වික්‍රමසිංහ ශක්තිමත් කර තිබූ ආර්ථිකයේ වර්ධන වේගය 6.2%කි.

2005න් පසුව, සාමය ඇති කිරීම සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ.ය හා ආණ්ඩුව අතර පැහැදිලි අවබෝධයක් වර්ධනය වන තත්ත්වයක් දැකීමට නොහැකිවූ අතර එය පැහැදිලි යුද්ධයක් දක්වා වර්ධනය විය. එල්.ටී.ටී.ඊ.යට කරුණා අම්මාන්ගෙන් ලැබුණු සහය නොමැතිවීමත්, නැගෙහිර ආරක්ෂක හමුදා මුදාගැනීමත් නිසා එල්.ටී.ටී.ඊ.ය දුර්වලවීමත්, ආණ්ඩුවද ඒ වනවිට යුද්ධය අරමුණුගතව හා ඉලක්ක ගතව මෙහෙයවීමත් නිසා 2009 දී එල්.ටී.ටී.ඊ. සංවිධානය යුදමය වශයෙන් පරාජය කිරීමට හැකිවීම, මහින්ද රාජපක්ෂ මහතා ලැබූ ජයග්‍රහණයක් බවට පත්විය. නමුත් එය පිටුපස රනිල් වික්‍රමසිංහ මහතාගේ දේශපාලන භාවිතය පිළිබඳ උදාහරණයකට භාවිතා කළ හැකි කාරණයක් එම වකවානුවේ පුවත්පත්වල පළ විය.

එනම්, යුද්ධය අවසාන කිරීමට පහසු වූ එක් කරුණක් වූයේ, එල්.ටී.ටී.ඊ. සංවිධානයට ජාත්‍යන්තර මුහුද හරහා සිදුකල සැපයුම් මාර්ග අඩාල කිරීමය. සංඛ්‍යා නිවැරදි නම්, එල්.ටී.ටී.ඊ. සංවිධානයට යුද උපකරණ රැගෙන ආ නැව් 11ක් පමණ විනාශ කිරීමට ශ්‍රී ලංකා නාවුක හමුදාවට කෙටි කාලයකදි හැකිවිය. මේ සඳහා මුහුදට ගොස් සිටි නාවික යාත්‍රා පිළිගැනීමට ත්‍රිකුණාමලය වරායේ උත්සවයක් පැවැත්විණි. එම උත්සවයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේ සිටි අමාත්‍යවරයෙක් වූ මිලින්ද මොරගොඩට ප්‍රකාශ කර ඇත්තේ ඔයාලාට ලැබුණු නැව (ඇමරිකාවෙන් වික්‍රමසිංහ ආණ්ඩුවට ලැබුණු යුද නැව) නිසා ජාත්‍යන්තර මුහුදට ගොස් එල්.ටී.ටී.ඊ. නැව් විනාශ කිරීමට හැකිවූ බවය.

## බලය අහිමිවූ හදිසි ජනාධිපතිවරණය

කෙසේ වෙතත් යුද ජයග්‍රහණයෙන් ඉක්බිති මහින්ද රාජපක්ෂ මහතා නැවත ජනාධිපතිවරණය ජය ගැනීමෙන් අනතුරුව රට තුළ සිය පාලනය සඳහා පහසු පරිසරයක් ඇතිවිය. රටේ ආර්ථික වර්ධන වේගය ඉහළ ගියේ බලා සිටියදීය. හේතුව විදේශ ණය විශාල ප්‍රමාණයක් යටිතල පහසුකම් මත අයෝජන ලෙස මුදාහැරීමය. එහි ප්‍රතිඵලය 2009 ආර්ථික වර්ධන වේගය 3.5%ක් වූ අතර 2010 දී 8%ද, 2011 දී 8.7%ක් හා 2012 දී 8.6% විය. මෙය ලංකාව අත්පත් කර ගත් විශාලම ආර්ථික වර්ධන වේගයන්ය. මෙම උත්කර්ශවත් ආර්ථික වර්ධන වේගයන් 2013දී 4.1%ක් දක්වා ක්ෂණිකව පහළ වැටෙන්නට විය. මෙම ආර්ථික වර්ධන වේගයේ අසාමාන්‍ය හැසිරීම පිටුපස පැවැතියේ වාණිජ ණය මත ඇති කළ ආයෝජනයන්ය.

එහෙත් පහසු කොන්දේසි යටතේ රටේ පාලනය පවත්වාගෙන යාමට ඇති අවස්ථාව අහිමිවන බව තේරුම් ගන්නා මහින්ද රාජපක්ෂ මහතා කල් ඇතිව ජනාධිපතිවරණයකට යාමට තීරණය කරයි. ඒ අනුව 2015 හදිසි ජනාධිපතිවරණය කැඳවීම මහින්ද රාජපක්ෂ මහතා ගත් වැරදි තීරණයක් බව ඔහුගේ පක්ෂයේම අය කියන්නට විය. එය කෙසේ වුවත්, ඔහුට අවශ්‍ය වූයේ ඉක්මණින් ජනාධිපතිවරණයක් කැඳවා එම ජයග්‍රහණය සමඟ අලුත් ආණ්ඩුවක් පිහිටුවීමටය. ඒ අන් කිසි දෙයක් නිසා නොව 2015න් ඉදිරියට එන ණය අර්බුදයට මුහුණදීමට ඔහුට පැවැති ජනවරමත් සමඟ අපහසු වන බව දන්නා නිසාය.

ඔහුට ඒ වනවිට ශක්තිමත් පාර්ලිමේන්තුවක් අවශ්‍ය විය. මහින්ද රාජපක්ෂ මහතා කොටස් වශයෙන් මැතිවරණ තැබීමට ජගතෙක් විය. උතුරු නැගෙනහිර පළාත් සභා මැතිවරණයද ඔහු පැවැත්වීය. පළාත් පාලන මැතිවරණ හා පළාත් සභා මැතිවරණ වාසි අවස්ථා හා වාසි සහගත ප්‍රදේශ ආශ්‍රිතව පැවැත්වූ අතර ජනාධිපතිවරණ දෙකකට මුහුණ දී, තෙවන ජනාධිපතිවරණයට පැරදීමේ අභියෝගය නොසලකා මුහුණ දෙන ලදි. නමුත් ඔහු පාර්ලිමේන්තු මැතිවරණවලට බිය විය. ඔහු යුද්ධයෙන් පසුව 2010 මහ මැතිවරණය පැවැත්වුවද ඒ හැරෙන්නට මහ මැතිවරණ පැවැත්වූයේ නැත. ඒ වෙනුවට විපක්ෂයේ මන්ත්‍රීන් උපාක්‍රමිකව එක් කරගෙන ආණ්ඩුව පවත්වගෙන ගියේය.

## ණය ගෙවීම භාරගත් අගමැති

කෙසේ වෙතත් 2015 දී රාජපක්ෂ මහතාට බලය අහිමිවන අතර බලයට පත් මෛත්‍රිපාල සිරිසේන මහතා කෙටි දිනකින් නැවත එක්සත් ජනතා නිදහස් සන්ධානය සමඟ කටයුතු කිරීමට යාමත්, දින 100 ආණ්ඩුව පිහිටුවීම හා 2015 අගෝස්තු මහ මැතිවරණයෙන් පසුව නැවතත් ආණ්ඩුව පිහිටුවීම සම්බන්ධයෙන් ඇතිවූ තත්වයනුත් සමඟ රනිල් වික්‍රමසිංහ මහතාට කටයුතු කරන්නට සිදු වන්නේ දේශපාලනිකව පහසු පරිසරයක නොවන්නේය.

එහෙත් ආර්ථික වශයෙන් ඇතිවී තිබෙන ගැටළුකාරී තත්ත්වයන් සමනය කරගනිමින් ජනතාවට දුන් අර්ථික සහන අඛණ්ඩව පවත්වාගෙන යාමටත් ඔහුට හැකිවිය. විදුලි බිල අඩු කිරීම, ඩීසල්, පෙට්‍රල්, ගෑස් මිල පහළ මට්ටමේ අඛණ්ඩව පවත්වාගෙන යාම මෙන්ම කිරිපිටි, හා වියලි ආහාර ද්‍රව්‍ය මිල අවම මට්ටමක අඛණ්ඩව දීර්ඝ කාලයක් පවත්වාගෙන යමින් සහන දීමට හැකිවිය.

මේ අතර ආර්ථික ප්‍රතිසංස්කරණ රාශියක් ඇති කිරීම සම්බන්ධයෙන්ද කටයුතු කරන ලද අතර සංවර්ධන ව්‍යාපෘති ලෙස දක්ෂිණ අධිවේගි මාර්ග දිගුව, මධ්‍යම අධිවේගි මාර්ගය, රුවන්පුර අධිවේගි මාර්ගය වැනි විශාල ව්‍යාපෘති ආරම්භ කරන්නේද ණය ගෙවීමට ඇති අභියෝගය පරාජය කරමින්ය.

ඒ අනුව මහින්ද රාජපක්ෂ මහතාගේ යුගයේ ගත් වාණිජ්‍ය ණය හා ස්වෛරීත්ව බැදුම්කර ගෙවීම සඳහා 2015 දී ඩොලර් බිලියන 2.9ක් පමණ අවශ්‍ය වූ අතර 2019 වන විට එය ඩොලර් බිලියන 4.6ක් විය. ඒ අතර 2018 ජනවාරි 31 වනදා ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට එකවර ඩොලර් බිලියනයක් ගෙවීමට සිදුවිය. මේ සඳහා මුදල් සම්පාදනය කර ගැනීමට එක් අතකින් දේශීයව හැකි වූ අතර තවත් විදේශ ණය ගැනීමටද සිදුවිය. මීට මාස කීපයකට පෙර පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂ ද සිල්වා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේ 2015 - 2019 ආණ්ඩුව ගත් ණයවලින් 80%ක් පමණ යෙදවීමට සිදුවූයේ ඊට පෙර ආණ්ඩු ගත් ණය ගෙවීමට බවය.

## බලය අත්හළ ආණ්ඩුවක ජනාධිපතිවීම

මේ අකාරයට වික්‍රමසිංහ මහතාට ආණ්ඩු ලබාගැනීමට සිදුවූයේ ආර්ථික වශයෙන් ඉතාම අහිතකර තත්ත්වයන්ට රට මුහුණ පා ඇති විටය. එහි උච්චතම අවස්ථාව එන්නේ මැතිවරණවලින් නොව ජන අරගලයකින් බලය අතහැර යන ආණ්ඩුවක් තුළ ජනාධිපති ලෙස කටයුතු කිරීමට යාමත් සමඟය. ඒ සමඟම ඔහු ආර්ථිකය මෙහෙයවන්නේ ස්ථාවර ආර්ථිකයක් සහිත රටක් නිර්මාණය කිරීමටය. මේ සඳහා රාජ්‍ය ආදායම වැඩි කිරීම, මහ බැංකුව ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය නීති සම්පාදනය, රාජ්‍ය පාලනයේදී අවශ්‍ය යහපාලන ගුණාංග ගොඩනැගීමට අවශ්‍ය නීති සම්මත කිරීම මෙන්ම ජනතාව බරක්වන රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම වැනි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට දැඩිව අරමුණු කරගෙන සිටියි.

මෙම නව යහපාලන ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මීළඟ ලිපියෙන් සලකා බලමු.

සරත් හේවගේ

Mr. President

# ලෝකය දෙකට බෙදෙනවා ඒක ආර්ථිකයට හොඳ නැහැ



චීනයේ පැවැති "එක් මාවතක් එක් තීරයක්" සමුළුවට සහභාගී වීමට ගොස් මෙරටට පැමිණි ජනපති රනිල් කෙලින්ම ගියේ එක්සත් ජාතික පක්ෂ විශේෂ මහා සම්මේලනයට සහභාගී වීමටය. චීනයට ගිය දූත පිරිස ලංකාවට පැමිණියේ 20 වැනි සිකුරාදා රාත්‍රියේය. සම්මේලනය ගැන තොරතුරු සොයා බැලීමට පවා ජනපතිට වේලාවක් වෙන් වූවේ ගුවන් යානයේ දී ය.

ජනපති රනිල්, පක්ෂයේ ජාතික සංවිධායක සාගලට පැවැරුවේ සම්මේලනයේ කටයුතු සංවිධානය වන ආකාරය ගැන සොයා බලන ලෙසයි. ලංකාවට පැමිණ ගුවන් යානයෙන් බැසගත් සාගල නිවසට යාමටත් පෙර පැමිණියේ සම්මේලනයේ කටයුතු ගැන සොයා බැලීමටය.

සාගල සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණය වෙත පැමිණෙන විටත් මහලේකම් රංගේ බණ්ඩාර ඇතුළු පිරිසක් එහි පැමිණ සිටියහ. එක්සත් ජාතික පක්ෂ විශේෂ මහ සමුළුවේ කටයුතු සංවිධානය වන ආකාරය ගැන මධ්‍යම රාත්‍රියට ආසන්න වන තෙක් සොයා බැලූ සාගල රත්නායක, සමුළුවේ න්‍යාය පත්‍රය සකස් කිරීම පක්ෂ නායක රනිල් සමඟ පසුදා සාකච්ඡා කොට අවසන් කිරීමට තීන්දුවක් ගත්තේය.

මහලේකම් රංගේ විසින් සම්මේලනයේ ආසන පිළියෙල කිරීමේ සිට අමුත්තන්ගේ කතා දක්වා සියලු කටයුතු සංවිධානය කළේය. ප්‍රධාන පීඨිකාවේ ආසන පැනවීමේදි සෑම ආරාධිතයෙකුගේම නම ආසනයේ ඇලවීමට ද ක්‍රියාකර තිබිණි.

## ලෙදර් ජැකට් එක

ජනපති රනිල් වික්‍රමසිංහ පැමිණි පසු සම්මේලනය ආරම්භ වූවේ ජනතා ඔල්වරසන් මැදය. පිළිගැනීමේ කතාවේ සිට නායකයාගේ කතාව දක්වා කතා 09ක් පැවැත්විණි. ජනපති රනිල් පැමිණියේ ලෙදර් ජැකට් එකක් ද පැළඳය. "සර් කොහෙන්ද මේ ජැකට් එක හොයා ගත්තේ. රැස්වීමට හොඳටම ගැලපෙනවා." සමුළුවට එන අතරතුර ජනපතිගෙන් විමසුවේ කෝට්ටේ සංවිධායක නීතිඥ දිනේෂ් විදානපතිරණය.

"ජනාධිපතිතුමා හැමදාම අලුත් විදියට හිතනවා." රංගේ කියද්දී ජනපති ද සිනාසෙමින් විශේෂ පීඨිකාවට ගොඩ වූවේය.

ඇමති මනූෂ සිය කතාව අවසන් කර පැමිණ ජනපති අසලට ගොස් "සර් අනාගතයේ කරන්න හදන වෙනස ගැන මම ආරම්භයක් ගත්තා. ඒක මෙතනින් නවතන්නේ නැතුව දිගටම ගෙනියනවා." යැයි කියද්දී ජනපති ඔහු අගය කළේය.

ප්‍රධාන පීඨිකාවේ සීමිත පිරිසකට පමණක් අසුන් පනවා තිබූ අතර ක්‍රීඩාංගණය මධ්‍යයේ ආධාරක මත පීඨිකාව සකස් කර තිබූ බැවින් මාධ්‍යවේදීන් හා නම් සටහන් ආරාධිතයන්ට හැර වෙනත් පිරිස එහි පැමිණීම සීමා කර තිබිණි. එහෙත් ප්‍රධාන පීඨිකාවේ නම් සඳහන් නොවන දෙදෙනෙකු එහි රැඳී සිටින බව මහලේකම් රංගේට පැමිණිලි කිහිපයක් ඉදිරිපත්ව තිබුණි. මේ ගැන විමර්ශනයක් කිරීමට ඔහු එම අවස්ථාවේදීම උපදෙස් දුන්නේ පක්ෂයේ විධායක අධ්‍යක්ෂ ශමල් සෙනරත්ටය.

## ඇමැති වෙනස

දීර්ඝ විදේශ සංචාරයක් නිමකර පැමිණිය ද ජනපති සිය රාජකාරි අතපසු නොකර නිවාඩු දිනයක් වූ ඉරිදා උදෑසන මන්නාරමට ගියේ ජාතික මිලාදුන් නබි උත්සවයට එක්වීමටය. පසුව ඔහු කාර්යාලයට පැමිණ වැඩ කටයුතුවල නිරත වූවේය. ඒ සඳුදාට නියමිත ඇමති විෂයන් වෙනස් කිරීමේ කටයුත්ත ගැනය. කාලයක් තිස්සේ විෂයයන් සංශෝධනය කිරීමට උත්සාහ කළත් සෞඛ්‍ය විෂය භාර ගැනීම වෛද්‍ය රමේෂ් පතිරණ අකමැත්ත පළ කිරීම නිසා එය පමා විය. නමුත් අවසානයේ ඔහු එම ඉල්ලීමට කැමැත් පළ කිරීමත් සමඟ ඇමති විෂය සංශෝධනය කිරීමට ජනපති පියවර ගත්තේය.

සඳුදා පෙරවරුවේ ජනපති සිය රාජකාරි ආරම්භ කළේ ඇමති විෂය සංශෝධනයත් සමඟිනි. මහින්ද අමරවීර, කෙහෙළිය රඹුක්වැල්ල හා රංජිත් සියඹලාපිටිය පැමිණ සිටියේ අමාත්‍ය විෂය සංශෝධනය වෙනුවෙන් දිවුරුම්දීමට ය.

එහිදි වෛද්‍ය රමේෂ් පතිරණ වැවිලි කර්මාන්ත විෂය අතහැරි අතර ඔහු සෞඛ්‍ය හා කර්මාන්ත අමාත්‍ය ධූරයන්හි දිවුරුම් දුන්නේය. කෙහෙළිය රඹුක්වැල්ල පරිසර අමාත්‍ය ධූරයේ දිවුරුම් දුන් අතර මහින්ද අමරවීර කෘෂි කර්ම අමාත්‍ය ධූරයට අමතරව වැවිලි කර්මාන්ත අමාත්‍ය ධූරයේ ද දිවුරුම් දුන්නේය. මුදල් රාජ්‍ය අමාත්‍ය ධූරයට අමතරව රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යවරයා ලෙස දිවුරුම් දුන්නේ රංජිත් සියඹලාපිටිය ය.

ජනපති එදින සවස්වරුව වන තෙක් රාජකාරි කිහිපයක නිතර වූවේය. ඒ අතර ආන්දෝලනාත්මක චීන නෞකාව පිළිබඳ ගැටළුවද වූවේය. එම චීන නෞකාව මෙරට නාරා ආයතනය සමඟ සමුද්‍රීය පරීක්ෂණ ගණනාවක් පැවැත්වීමට සාකච්ඡා කර තිබූ අතර එහෙත් භූ-දේශපාලන ගැටළු හමුවේ චීන නෞකාවට මෙරටට පැමිණීමට රජය අවසර දී නොතිබිණි.

එහෙත් ඉන්දීයන් සාගර කලාපයේ පරීක්ෂණ කටයුතුවල ඔවුන් දිගටම නිරතව සිටි බැවින් ඉන්ධන, ආහාර හා ජලය ලබා ගැනීම වෙනුවෙන් නැවට මෙරටට පැමිණීමට රජය අවසර ලබා දුන්නේය. එම කටයුතු සම්බන්ධීකරණය ජනපති භාරදී තිබුණේ කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායකටය. ඔහු එම රාජකාරිය ජනපති වෙනුවෙන් අකුරටම ඉටු කර තිබිණි.

එදින සවස ඇමති මණ්ඩල රැස්වීම ද පැවැති අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය වාරිකය නිදහස්වීම ගැන ද ජනපති පැහැදිලි කිරීමක් කළේය. මන්ද පළමු සමාලෝචනයේදි අයි.එම්.එෆ්. නිලධාරීන් දෙවන වාරිකය නිදහස් කිරිමේ කාර්ය මණ්ඩල ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද කළේය. එම නිසා ඔහු මේ ගැන කරුණු පැහැදිලි කළේය. ජනපති රනිල් සම්මේලනයේදි කියූ පරිදි පාර්ලිමේන්තු අය වැය කාර්යාල පනත හා 2023 අංක 09 දරන දූෂණ විරෝධි පනත යන පනත් දෙක එදින ඇමති මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබීය.

අඟහරුවාදා පෙරවරුවේ ජනපති රනිල් උදෙන්ම ආරක්ෂක කවුන්සිලය වෙත ගිය අතර දහවල් නැවත කාර්යාලය වෙත පැමිණියේ තානාපතිවරු තිදෙනෙකුගේ අක්ත්‍රපත්‍ර භාර ගැනීමේ උත්සවයක් පැවැති බැවිනි. එය අවසන් කළ ජනපති රනිල් කෙටි විවේකයක් ගැනීම වෙනුවෙන් නිවසට ගියේ චීනයේ සිට පැමිණි පසු දිගටම අවිවේකී වීම නිසාය.

## අය වැය යෝජනා

බදාදා පෙරවරුවේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව වෙත ජනපති ගියේ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ 117 වැනි වාර්ෂික සැසිය ඇමතීමටය. එදින දහවල් ජනපති රනිල් මුදල් අමාත්‍යාංශ නිලධාරීන්, මහ බැංකුවේ නිලධාරීන්, ජනපති කාර්ය මණ්ඩල ප්‍රධානි හා ජනපති ලේකම් සමන් ඒකනායක ඇතුළු නිලධාරීන් පිරිසක් මුණ ගැසුණේ අය වැය ගැන කතා කිරීමටය.

එහිදී බදු ඉහළ නැංවිම ගැන මෙන්ම බදු අවම කොට ආදායම් ඉහළ නැංවීම ගැන සේම වැටුප් වැඩි කිරීම ගැනද සාකච්ඡා පැවැත්විණි. අවසන් තීන්දුවකින් තොරව එම සාකච්ඡා අවසන්වී තිබූ අතර නැවත මුණ ගැසී සාකච්ඡා කිරීමට එකඟතාවයෙන් එය නිමාවට පත්වූවේය.

ජනපති රනිල් එදින සවස මොනාක් ඉම්පීරියල් හෝටලය වෙත ගියේ ජාතික තොරතුරු තාක්ෂණ සම්මාන උළෙලට සහභාගී වීමටය. බ්‍රහස්පතින්දා මුදල් අමාත්‍යාංශය වෙත ජනපති පැමිණියේ කාලයකට පසුවය. ඒ ඔහු රටේ නොසිටිම හා වෙනත් රාජකාරී යෙදීම මත මුදල් අමාත්‍යාංශය වෙත පැමිණීමට නොහැකිවීම නිසාවෙනි. එම අවස්ථාවට මැති ඇමතිවරු මෙන්ම නිලධාරීන් රැසක් ද පැමිණ සිටියෝය.

## දෙවන වාරිකය දෙන්න එපා කියලා

ජනපතිගේ චීන සංචාරය ගැන මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවන ණය වාරිකය ලබා ගැනීම ගැන පිරිස ජනපතිට හා කාර්ය මණ්ඩල ප්‍රධානි සාගලට ප්‍රශංසාව පළ කළහ.

"දෙවන වාරිකය දෙන්න එපා කියලා විපක්ෂයට සම්බන්ධ රිසර්ච් ආයතනයක් අයි.එම්.එෆ්. එකට කේලම් කිව්වා කියලා ආරංචියි." ඇමති මනූෂ කීවේ බැරෑරුම්වය.

"ඔව් ඒකේ ප්‍රධානියාට ඕන වෙලා තියෙනවානේ ව්‍යවස්ථාදායක සභාවට උපදෙස් දෙන්න. ඒක නිසා තමයි අයි.එම්.එෆ්. එක අපිට කිව්වේ අල්ලස් කොමිසම ඇතුළු කොමිෂන් සභාවලට නිලධාරීන් පත් කරන කොට ඒකට උපදෙස් දෙන්න කමිටුවක් පත් කරන්න කියලා. ව්‍යවස්ථාදායක සභාවට ඉහළින් කමිටු පත් කරන්න ජනාධිපතිතුමා කැමති වුනේ නෑ. ජනාධිපතිතුමා එක්ක ෂෙහාන් ඇමතිතුමාත් එකතු වෙලා එක මතයක හිටියා මේක කරන්න බෑ කියලා." සාගල රත්නායක පිළිතුරු බැන්දේය.

"කොහොම වුණත් අපි අල්ලස් කොමිසම ඇතුළු දූෂණ විරෝධි ආයතනවලට නිලධාරීන් පත් කිරීමේදි ඔවුන්ගේ සුදුසුකම් මෙන්ම ඔවුන් කටයුතු කළ යුතු ආකාරය ගැන නීති රෙගුලාසි දාන්න කටයුතු කරනවා. ඒක පිළිගන්න අයි.එම්.එෆ්. එක කැමති වුනා." ඇමති ෂෙහාන් කීවේ මොරොක්කෝ සමුළුව ද සිහිපත් කරමිනි.

"ඇමති විෂය මාරුව ගැන ලොකු හා හෝවක් ගිහින් තියෙනවා. පොහොට්ටුව කළකිරීමෙන් ඉන්නා බව තමයි ඒ කතාවලින් පැහැදිලි වෙන්නේ. ජනාධිපතිතුමා එයාලගෙන් අහලා කළේ නෑ කියන එක තමයි චෝදනාව." රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දිනිත් චින්තක ද කතාවට එකතු වූවේය.

"ජනාධිපතිවරු වැඩ කරන්නේ ඒ අයගේ කැමැත්තට. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙත් ඒක පැහැදිලිව තියෙනවා. හිටපු ජනාධිපතිවරු හැමෝම වැඩ කරලා තියෙන්නේ එහෙම. ඒ නිසානේ මිනිස්සු පාරට බැස්සේ ජනාධිපතිවරු ඉලක්ක කරගෙන. කාගෙන්වත් අහලා ජනාධිපතිතුමා වැඩ කරන්න ඕනේ නෑ. මොකද හොඳ නරක දෙකම එන්නේ ජනාධිපතිතුමාටනේ." මන්ත්‍රී වජිර ද කිවේ තරමක් ආවේගයෙනි.

"එක පැත්තකින් තරුණ නායකයෝ ටිකක් ජනාධිපතිතුමා එක්ක ඉස්සරහට එන එක ගැනත් සමහරුන්ට හිතේ අමාරු ඇති." මහාචාර්ය ආශු ද කතාවට එක් වූවේ එලෙසිනි.

මැද පෙරදිග ගැටුම ගැන කරුණු මතු කළේ ජනපතිය. "ලෝකය කොටස් දෙකකට බෙදෙමින් යන්නේ. මේක ආර්ථිකයට හොඳ නෑ. ඉන්ධන මිල ඉහළයාම වගේ දේවල් වර්ධනය වෙන්න පුළුවන්. අපි මේවට විසඳුම් සොයන්න ඕනේ." ජනපති අදහස එය විය.

"සර් බජට් එකේ මොනවද තියෙන්නේ." ඒ පැනය ඇමති ප්‍රසන්නගෙනි. "අය වැය රහස් කියලා කියන්නේ ඒකටනේ." ජනපති පිළිතුරු දුන්නේ සිනාමුසුවය. අය වැය ගැන සාකච්ඡාව ආරම්භ වූවේ ඉන් පසුවය.

Mediaman

# රුපියල් 20000ක් ඇද්ද? වෙන මොනවත් එපාද?




2024ට අදාළ අය-වැය ගෙන එන්නට ඇත්තේ තවත් සති කිහිපයක්ය. ඒ පසුබිමේ වෘත්තීය සමිති මාෆියාව ෂයිලොක් පන්නයේ ඉල්ලීම් සටන් පාඨ ලෙස ඉදිරිපත් කරන්නට ගෙන ඇත. ඒවා ඉටු නොකළොත් රට කොට උඩ යවන්න කරන වර්ජන ගැනත් තර්ජනය කරමින් ඇත. නමුත් මේවා 2024ට පමණක් අලුතෙන් ඉදිරිපත් වූවක් නම් නොවේය. එළඹෙන වසරට අදාළ අයවැය ඊට පෙර වසරේ නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන නිසා ඔක්තෝබර් මාසයේ සිට විවිධ සටන් පාඨ ඉදිරිපත් කර සංදර්ශන පැවැත්වීම කොහොමටත් වෘත්තීය සමිති මාෆියාවේ සම්ප්‍රදායක්ය.

ඒ අනුව යමින් මෙවරත් වෘත්තීය සමිති මාෆියාව වැඩ අල්ලා ඇත. ඊට අදාළ සටන් පාඨ ජවිපෙ ප්‍රමුඛ වෘත්තීය සමිති මාෆියාවේ ගෝඩ් ෆාදර්ලා ඉදිරිපත් කර ඇත. එහි පළමු ඉල්ලීම වන්නේ රාජ්‍ය සේවක වැටුප් වැඩිකිරීමක්ය. එයත් රුපියල් 20,000 කින් ය. එහිදී තර්කය වී ඇත්තේ වසර 7කින් රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීමක් සිදුකර නොමැති බවය. මොනවා වුණත් ඒ කතාව නම් ඇත්තය. 2015 ජනවාරි 08 පැවති ජනාධිපතිවරණය අවස්ථාවේ, එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ කිව්වේ, පවතින ආර්ථික තත්වය අනුව රුපියල් 2,000කට වඩා වැටුප් වැඩිවීමක් ගැන පොරොන්දුවක් දීමට තමන්ට නොහැකි බවය. එදා ජනපති සටනේ විපක්ෂයේ පොදු අපේක්ෂකයා වූයේ මෛත්‍රීපාල සිරිසේනය. එදා මෛත්‍රී ජනපති කරන සටනේ ප්‍රධාන නියමුවා වූ එවකට විපක්ෂ නායක වූ රනිල් වික්‍රමසිංහ, මෛත්‍රීට උපදෙස් දුන්නේ, **"තමන් ජනාධිපති වුවහොත් රාජ්‍ය සේවක වැටුප අවම රුපියල් 10,000 කින් වැඩිකරන"** පොරොන්දුව බය නැතුව ලබාදෙන ලෙසය. එසේම එය නව ආණ්ඩුව පිහිටුවා සිදුකරන දින 100යේ වැඩපිළිවෙලට ඇතුළත් කරන ලෙසය. ඒ කියපු ලෙසටම මෛත්‍රී ජනපති කර පළමු දින 100ය ගතවන අවස්ථාවේ, රාජ්‍ය සේවයේ සිටි සියලු දෙනාට රුපියල් 10,000ක අවමයක් ලෙස වැටුප් වැඩිවීම ක්‍රියාත්මක කළේය. ඒ කියන්නේ රාජ්‍ය සේවයේ සිටි සියලු දෙනාට රුපියල් 10,000 කට වැඩි වැටුප් වැඩිවීමක් සිදුවූ බවය. එපමණක් නොව ගෑස්, ඉන්ධන ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක මිල පහත හෙළුවේද ඒ ආණ්ඩුවය. එදා ඒ කටයුතු වෙනුවෙන් නායකත්වය ගෙන කටයුතු කළේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ ය.

ඒ මෑත ඉතිහාසයේ සිදුවූ විශාලම වැටුප් වැඩි කිරීම මෙන්ම ජනතාවට ලැබුණු සහන මල්ල විය. එයින් පසුව ජනතාවට සහනයක් ලැබුණේ නැත. එදා ඒ සහන ලබාදීමට හැකිවූයේ මෙකී සහන සමඟ රාජ්‍ය ආදායම ඉහළ දැමීමට ද කටයුතු යෙදුන නිසාය. එසේම ඉහළ පොලී අනුපාත යටතේ කෙටි කාලීන ගෙවීම් පදනම් සහිත වාණිජ ණය ගනිමින් ගෙන ගිය ප්‍රදර්ශන සංවර්ධනය වෙනුවට රටේ ආර්ථිකය නිවැරදි දිශාවකට යොමු කළ නිසාය. ආදායම් වියදම් සම්බන්ධව නිසි ඉලක්කයක් සහ නිවැරදි තක්සේරුවක් ඇතිව දුරදර්ශී ලෙස කටයුතු කළ නිසාය. එනිසා ඖෂධ මිල 90% කින් පමණ පහළ දැමීමට හැකියාව ලැබුණා පමණක් නොව, ඇස් කාච, පිළිකා ඖෂධ, ස්ටේන් පවා රෝගීන්ට නොමිලේ දෙන්නට හැකිවිය. ඒ සියල්ල සිදුකරන්න හැකිවූයේ රජය නිසි මූල්‍ය විනයකින් යුතුව හැසිරවූ නිසාය.

එදා 1990 සුවසැරිය ගිලන් රථ සේවය හඳුන්වාදෙන විට වෘත්තීය සමිති කිව්වේ මොනවද? රජයේ වෛද්‍ය නිලධාරී සංගමය එදා ප්‍රසිද්ධ මාධ්‍ය හමු පවත්වා කිව්වේ, සුවසැරිය ගිලන් රථ රෝහල් පරිශ්‍රයේ නැවත්වීමට ඉඩ නොදෙන බවය. සුව සැරියෙන් ගෙනෙන රෝගීන් කරන්ට් වැදී මිය යා හැකි බවය. වෛද්‍යවරුන් සිය වෘත්තීයභාවය ගණිකා සේවයේ දමා එදා ජනතාව නොමග යැව්වේ එහෙමය. නමුත් සුවසැරිය ගිලන් රථ සේවය කොතරම් මෙහෙයක් ජනතාවට සිදුකරනවාද? එය අත්දැක තිබියදී වුවත්, එදා තමන් ජනතාව රැවටූ බව පිළිගන්න තරම් වෘත්තියමය භාවයක්, මහත්මා ගතියක් ඒ බොරු චෝදනා නගා ජනතාව භීතියට පත්කළ වෘත්තීය සමිතිවලට තිබෙනවාද? නැත.

එපමණක් නොව, එදා මහ බැංකුව කොල්ලකෑවා, රාජ්‍ය භාණ්ඩාගාරය හිස් කළා කියා ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ දේශපාලන ප්‍රතිරූපයට පහර ගැසූ වෘත්තීය සමිති සහ ඒවායේ ගෝඩ් ෆාදර්ලා, 2022 වසරේ ඇත්තටම රාජ්‍ය භාණ්ඩාගාරය හිස් වූ විට කිව්වේ කුමක්ද? ඩොලර් සංචිතය බිංදුවට හිඳෙන විට කළේ මොනවද? අවසානයේ ගෝඨාභය රාජපක්ෂ පාලනය යටතේ රට බංකොලොත් වනතුරු ඔවුන් කළේ මොනවද? රටේ තෙල් පෝලිම් ගෑස් පෝලිම් ඇතිවන විට කළේ මොනවද? දිනකට පැය 12-14ක විදුලි කප්පාදු සිදුවන විට කළේ මොනවද? කර්මාන්ත වැසෙන විට මොනවද කළේ? ඔවුන් කළ දෙයක් නැත.

නමුත් සිහිබුද්ධියක් ඇතිව මේ වෘත්තීය සමිති මාෆියාවේ කෙරුවාව විමසුවහොත් පැහැදිළිව පෙනී යන්නේ, ඒ හිස් ටින් බෙලෙක්ක වැඩිපුරම හඬ නගන්නේ, විරෝධය දක්වන්නේ, ආර්ථිකය නිසි මඟට ගෙන, ජන ජීවිතය ඉහළ මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය මූලික අඩිතාලම සකසන විටදී බවය. ඒ තරම් මේ වෘත්තීය සමිති මාෆියාවට නොරුස්සන කිසිවක් නොමැති බවය. දැන් ප්‍රශ්නය වන්නේ වෘත්තීය සමිති මාෆියාව එසේ හැසිරෙන්නේ ඇයිද යන්නය.

ඒ අන් කිසිවක් නිසා නොව, ආර්ථිකය නිවැරදි අඩිතාලමක් මත වසර කිහිපයක් ගෙන ගියහොත් ආර්ථිකය ශක්තිමත් වන නිසාය. ජනතාවගේ ජීවන තත්වය ඉහළ යන නිසාය. එවිට මුලින්ම තට්ටු වන්නේ, මේ රටේ ජාතික නිෂ්පාදනයට සත පනහක දායකත්වයක් නැති වෘත්තීය සමිති මාෆියාවට වන නිසාය. ඒ නිසා ඔවුන්ගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා අරාජිකත්වය, අසාර්ථකත්වය සහ අර්බුද සහිත වටපිටාව කියන්නේ නැතුවම බැරි දේවල්ය.

ඒ නිසා වසර 7කට පසුව වැටුප් වැඩිවීමක් නොලැබීම නිසා, රුපියල් 20,000ක් ඉල්ලන වෘත්තීය සමිති මාෆියාව, වසර 7කට පෙර ඉතිහාසයේ ලොකුම සහන මල්ල සමඟ ජන ජීවිතය ඉහළට ඔසවා තැබූ රනිල්ගේ පාලනය සිහිපත් කරන්නේ නැත. ඉතිහාසයේ ඉහළම වැටුප් වැඩිවීම සිදු කළ නායකයා කවුද කියන්නෙත් නැත. ඒ පාලනය බිඳ දැමීම නිසා රටම අමු සොහොනක් වෙන්න ගිය බව කියන්නේද නැත. ඊට අදාළ තමන් සිදු කළ වැඩ කොටස කියන්නේද නැත. අවම වශයෙන් ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයට රට මුහුණදී යන්තම් සැනසුම් සුසුමක් හෙළන්න ලැබුණු පසුබිමේ රුපියල් 20,000ක වැටුප් වැඩිවීමක් කරන්නේ කොහොමද යන සරල ප්‍රශ්නයවත් ඔවුන්ට අදාළ නැත.


එපමණක් නොව, මේ වෘත්තීය සමිති මාෆියාව, වක්‍ර බදු අඩුකර ඍජු බදු වැඩි කිරීමටද විරුද්ධ ය. එහිදී ඔවුන් හිට ගන්නේ මෙරට අවිධිමත් ආර්ථිකයේ ගැටගැසී සිටින 60%ක පීඩිතයන් සමඟ නොව, 20%ක් පමණ වන ආර්ථික දුෂ්කරතා නොමැති පිරිස සමඟය. රාජ්‍ය ව්‍යාපාර කිරීමෙන් ඉවත් වනවාටද විරුද්ධය. වෘත්තීය සමිති මාෆියාව එහිදී පෙනී සිටින්නේ වසරකට බිලියන ගණනක් ගිල දමන රාජ්‍ය ව්‍යාපාර කොහොම හෝ කරගෙන යායුතුය යන න්‍යායේ ය. රාජ්‍ය සේවය ප්‍රතිව්‍යුහගත කිරීමට ද විරුද්ධය. එහිදී ඔවුන් පෙනී සිටින්නේ කිසිම ඵලදායිතාවක් නැතත් වැටුප් දියවු කියන න්‍යායට ය. සමාජ ආරක්ෂණ දැළ ශක්තිමත් කිරීමටද ඔවුන් විරුද්ධය. ඔවුන් පෙනී සිටින්නේ එදාවේල වෙනුවෙන්ය. මේ ආකාරයට රාජ්‍ය ආදායම සහ සමාජ සුබ සාධනය සම්බන්ධව පමණක් නොව, කවර ක්ෂේත්‍රයක් සම්බන්ධව සැළකුවද එකී කවර ක්ෂේත්‍රයක් සම්බන්ධව වුවත් වෘත්තීය සමිති මාෆියාවේ හැසිරීම පරස්පරය. අතාර්කිකය.

ඒ බව තවදුරටත් තහවුරු කරගන්නට වැඩිදුර යායුතු නැත. ඊට රුපියල් 20,000 වැටුප් වැඩිවීම ඉල්ලන සටන් පාඨය හොඳටම ප්‍රමාණවත්ය. මෙරට මිලියන 22ක ජනගහනයෙන් රාජ්‍ය සේවයේ නිරත ප්‍රමාණය ලක්ෂ 15කට ආසන්නය. ඒ සියල්ලට රුපියල් 20,000ක වැටුප් වැඩිවීමක් ලබාදෙන්නට දැනට රාජ්‍ය සේවක වැටුප් සඳහා මාසිකව වැයවන බිලියන 80කට වැඩි මුදලට අමතරව රුපියල් 30,000,000,000ක මුදලක්, එනම් බිලියන 30ක් අමතරව මාසිකව අවශ්‍යය. ඒ මුදල් සපයාගන්න සිදුවන්නේ අලුතින් මුදල් මුද්‍රණය කිරීම හරහා ය. හිතෙන හිතෙන වෙලාවට මුදල් මුද්‍රණය කරමින් පසුගිය පාලනය වරද්දාගත් බව ප්‍රසිද්ධ කාරණයක් ය. එය නැවතුණේ ලෝකයේ ඉහළම උද්ධමනයක් ඇති රටවල්වල ඉහළම තැනට වැටිලාය. එසේම ආර්ථික අර්බුදය හේතුවෙන් රාජ්‍ය අංශයේ වැටුප් කප්පාදු වූයේද නැත. නමුත් පෞද්ගලික අංශයේ බරපතළ වැටුප් කප්පාදු සිදුවිය. රට යන්තමින් හුස්මක් ගෙන නැගිටින පසුබිමේ මේ වෘත්තීය සමිති මාෆියාව ක්ෂණික වැටුප් වැඩිවීමක් ඉල්ලීම කොහොම නම් සාධාරණීකරණය කරන්නද?

සැබවින්ම මේ මොහොතේ එවැන්නක් සිදු කළ නොහැකි බව මේ මාෆියාව හොඳටම දන්නා අතර, නමුත් 2024 අයවැය හරහා රාජ්‍ය සේවකයන්ට මෙන්ම පොදුවේ මෙරට වැඩකරන ජනතාවට සහන ගෙන ඒමේ සූදානමක් ඇති බව සම්බන්ධවත් දැනුවත්ය. ඒ බව රාජ්‍ය මුදල් අමාත්‍යවරුන් ද විටින් විට පවසා ඇත. ඒ තුළ ඔවුන් සූදානම් වන්නේ රනිල් වික්‍රමසිංහ පාලනය ජනතාවට දෙන දේ තම මැදිහත්වීමේ ප්‍රතිඵලයක් ලෙස පෙන්නා ලකුණු දමා ගන්නටය. ඒ හරහා හෝ තම පැවැත්ම තහවුරු කරගන්නටය. නමුත් ජනතාව මෙහිදී සබුද්ධිකව මේ වෘත්තීය සමිති වෙතින් ඇසිය යුතු ප්‍රශ්නත් ඇත. එනම් රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම කියා වෙනම වැටුප් වැඩිවීමක් ඉල්ලුවේ ඇයි? පෞද්ගලික අංශය මෙරට ජාතික නිෂ්පාදනයට අදාළ නැද්ද? රාජ්‍ය සේවකයා මුහුණදෙන සමාජ ආර්ථික ගැටළු පෞද්ගලික අංශයට නැද්ද? ජීවන තත්වය ඉහළ යායුතු වන්නේ රාජ්‍ය සේවකයාගේ පමණද? යන්තමින් ආර්ථික අර්බුදයේ දරුණු අවධානම පසුකරන පසුබිමේ ඇතිවන සුළු කම්පනයකින් පවා රට යළිත් අගාධයකට වැටුණොත් එහි වගකීම වෘත්තීය සමිති මාෆියාව භාර ගන්නවාද? අමාරුවෙන් ගොඩගත්ත රට සටන් පාඨවලින් උස්සලා පොළවේ ගහන්න හදන උඹලා මොන මිනිස්සුද?

කුසල් ජයම්පති

# රනිල් දැන් වෙනස්



තමන් වෙනස් වෙන්න ඕන තමන් කැමති විදිහට සහ තමන්ට පහසු විදියට මිසක් ලෝකය කැමති විදිහට සහ ලෝකයට අවශ්‍ය විදිහට නොවේ. මේක අභියෝගයක්. තමන්ට කැමැති විදිහට දේවල් වෙනවා කියන්නේ ලෝකය ඒකට කැමැති වෙන එක නෙවෙයි. ලෝකයක් තමන්ට විරුද්ධ වෙනවා කියන එක. ඒත් එතනදි තමන් ලෝකයට එරෙහි වීම ජයගැනීම තුළ ලෝකය තමන්ට යටත් වීමක් වෙනවා කියන එක වෙන්නේ. ඒ කියන්නේ තමන්ට අනුව ලෝකය වෙනස් කළ හැකියි කියන එක. එහෙම නම් ලෝකය වෙනස් කරන්න කවුරුම හරි කල්පනා කරනවා නම් සියල්ලට පෙර තමන් වෙනස් විය යුතුයි. තමන් වෙනස් නොවී ඒ කියන්නේ පවතින භාවිතය පිළිගනිමින් ලෝකය වෙනස් කරන්න බැහැ. අනික ඒක තක්කඩිකමක්. මොකද ලෝකය වෙනස් කරන්න ඕන වෙන්නේ, ඒක පිළිගන්න බැරි නිසානේ. ඒ පිළිගන්න බැරි තත්වය තමන්ගේ භාවිතය කරගෙන ලෝකය වෙනස් කරන්න යෑම බොරුවක්.

මේ නිසා රටක් වෙනස් කරන්න නම් ඊට නායකත්වය ගන්න කෙනා සියල්ලට පෙර වෙනස් වෙන්න ඕන. අනෙකා වෙනස් කරන්න නම් තමන් වෙනස් වෙන්න ඕන. **"අවවාදයට වඩා ආදර්ශය උතුම්"** කියලා අපි අහලා තියෙන වදනෙන් කියන්නෙත් ඒක. මේ අභියෝග යක්. දෘඩ සටනක්. ප්‍රතිප්‍රහාරපිට ප්‍රහාර එල්ල වන අමාරු සටනක්. මඩ, අවලාද, ගැරහීම් වන සටනක්. තුවාල සිදුවිය හැකි මාරාන්තික විය හැකි සටනක්. ඒ නිසා මේ අභියෝගය භාරගැනීමට ලොකු ශක්තියක්, අධිෂ්ඨානයක්, ධෛර්යයක් ඕන. ඒ විතරක් නොවෙයි. ඒකට අවශ්‍යයි දැනුමක්, පරිචයක්, සැලසුමක්, වැඩපිළිවෙලක්. වැදගත්ම දේ ප්‍රතිපත්තිගරුක වෙන්න ඕන තමන් පටන් ගත් සටනේ දිගටම අවසාන ජයග්‍රහණය තෙක් රැඳී සිටීමට. අනෙක් දේ මේ ජයග්‍රහණය කියන්නේ තමන්ට ලැබෙන දෙයක් නොවෙයි. සෙසු අයටත් ලැබෙන දෙයක්. ප්‍රතිලාභය හැමෝටම. ඒ කියන්නේ තමන් වෙනස් වීම පරාර්ථකාමී වැඩක්.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ පසුගියදා එක්සත් ජාතික පක්ෂයේ විශේෂ සම්මේලනය අමතමින් කළ කතාවේදී එක තැනක කියනවා **"අනුන්ගේ දේ බලලා වෙනස් වෙන්න එපා, වෙනස තමන්ගෙන් පටන් ගන්න"** කියලා. ජනාධිපතිවරයා මෙතනදි තමන්ව ආදර්ශයට අරගෙන රටේ අභිවෘද්ධිය වෙනුවෙන් තමන් වෙනස් වූ බව කියනවා. දේශපාලනයේ දී ඕනෑම දේශපාලන නායකයෙක්, පක්ෂයක් කටයුතු කරන්නේ ඉලක්කයක් අරමුණු කරගෙන. බලය අත්පත් කරගැනීම තමයි මූලික. නමුත් මේ කාරණයේදී පරදුවට තබන්නේ රටත්, ජනතාවත්. මොකද කිසිවකු හෝ බලය අත්පත් කරගැනීම රටක ජනතාවකට ලාභයක් වෙන්න තියෙන ඉඩකඩ සීමිත වීම විය හැකි නිසා. මේ තත්වයන් මත මේ රටට සිදු වෙච්ච අලාභයන් ද බහුලයි.

රටේ සංවර්ධනය වෙනුවට වුණේ අවවර්ධනය. නිදහසෙන් පසුව ගෙවුණු අවුරුදු 75 තුළ පාලකයන් මොකද කළේ කියලා මිනිස්සු ප්‍රශ්න කරන්නේ ඒකයි. ඇත්තටම මේ රටට තිබූ හැකියාවන් අවස්ථාවන් අනුව රට තිබිය යුත්තේ මේ බංකොලොත් තැන නොවෙයි කියන එක පැහැදිලි කාරණාවක්. ඒ වගේම මෙතනදි පාලකයන්ට විතරක් දොස් කියන්න බැහැ. ජනතාවත් හරි හරියටම මේ දේට වගකිව යුතුයි. මොකද මේ තත්වයන් පවත්වාගෙන යෑම ජනතා ආශිර්වාදයෙන්ම සිදුව ඇති නිසා. ජනතාව අනුමත කරපු නිසා. ජනවරම තමයි රට මේ තැනට ඇදලා දාන්න පාලකයන්ට ලැබුණ ලොකුම අවිය. පාලකයන් බොහෝ විටම ජනවරමට පිටුපෑමක්, කරනවාට වඩා ජනවරම අර්ථකථනය වෙච්ච හැටියට වැඩ කරලා තියෙනවා. පාලකයන් ගන්නා තීන්දු තීරණ සිද්ධ වුණේ තමන්ට ලැබුණු ජනවරම මතයි. ආසන්නතම උදාහරණය පසුගිය ගෝඨා පාලනය. එයා ජනවරමක් ඉල්ලුවා රට හදන්න. එයා ආවොත් කරන්නේ මේවාය, ඒවා කරලා රට හදනවා කිව්වා. වැඩපිළිවෙලක් ඉදිරිපත් කළා. නමුත් ඒ වැඩපිළිවෙල කෙතරම් අතාර්කික වුණත්, විහිළු සහගත වුණත්, ජනතාව බහුතරයක් ඒක අනුමත කළා. ඒ අනුව ගෝඨා සහ ඒ ආණ්ඩුව වැඩ කළා. නියමිත පරිදිම රට ක්‍රමයෙන් කඩා වැටෙන්න ගත්තා. ඒක නවත්ත ගන්නත් විසඳුම් හෝ තිබුණේ නැහැ. තිබෙන්න විදිහක් නැහැ. මොකද මේ අය හිතුවා තමන්ගේ වැඩපිළිවෙල තමා නිවැරදිම කියලා හරි තමන්ට වෙන මොකක් හරි වාසියක් ඒක තුළ තිබුණ නිසා විකල්ප අදහස් ප්‍රතික්ෂේප කරලා තිබුණේ. අවසානයේදි රට බංකොලොත් වුණා. දැන් මේකට වගකිව යුත්තේ ගෝඨාභයවත් ඒ ආණ්ඩුවවත් විතරක් නෙවෙයි. මේ අයට බලය දුන්නු ජන කොටසත් ඒක භාර ගන්න ඕන. ඉතිං ජනවරම කියන එක බලදේශපාලනයේදි තීරණාත්මක වුණාට රටක් සංවර්ධනයේ දී තීරණාත්මක විය යුතු නැහැ කියන එක පැහැදිලියි.

වර්තමාන ජනාධිපතිවරයාට ආණ්ඩුවට ජනවරමක් නැහැ, ඒ නිසා ඉල්ලා අස්වී මැතිවරණ පැවැත්විය යුතුයි කියන එක විපක්ෂයේ ප්‍රධාන සටන් පාඨයක්. මේක හරි වෙන්න පුළුවන් විපක්ෂ කියන විදිහට පැහැදිලි ජනවරමක් ලැබුණාම රටට ජනතාවට හොඳම දේ ලැබෙනවා නම්. විපක්ෂ ජනවරම උරගා බලන්න කියන්නේ එයාල ඒකෙන් බලයට පත්වෙනවා කියලා විශ්වාස කරන නිසා. නමුත් මෙතනදි බලන්න ඕන එයාලා බලයට පත් වුණාම මොකද කරන්නේ කියන එක. එයාල ඉදිරිපත් කරන වැඩපිළිවෙලකින් රටේ අර්බුදය විසඳෙනවද, රටේ අනාගතය අභිවෘද්ධියට පත්වෙනවද, ජනතාවගේ ජීවිත මීට වඩා සුවපත් කරනවාද? කියන එක. ඇත්තටම එහෙම දෙයක් නැහැ. ආණ්ඩුවට එරෙහි වීමේ සාම්ප්‍රදායික වුවමණාව නිසා කෑකෝ ගැසීමක් හැර වෙන මොකවත් නැහැ. නිශ්චිත පැහැදිලි දේශපාලන ආර්ථික ප්‍රතිපත්තියක් ඇත්තේම නැහැ. සරළ මට්ටමකින්වත් නැහැ. ඒ අවුල හොඳටම පෙනෙනවා මෙයාලා තමන්ගේ ප්‍රතිපත්ති කියලා ඉදිරිපත් කරලා තියෙන ලේඛනවල, විටින් විට ගෙන එන සටන්පාඨවල පරස්පරයන් නිසා. මේ නිසා මේ අය කියන කිසි දෙයක් ප්‍රායෝගිකව කරන්න පුළුවන් දේවල් නෙවෙයි. බහුභූත.

ඒ ඒ වේලාවවට ජනතාව මුහුණදෙන පීඩාවන් සටන් පාඨ කරගන්නවා. ඒවා ජනප්‍රිය වෙනවා. මොකද ජනතාවගේ එදිනෙදා වුවමණාවන් ඒවා තුළ තියෙන නිසා. සටන් පාඨ ජනප්‍රිය වුණාට ඒවාට විසඳන්න ගන්න වෙන විසඳුම් එහෙම ජනප්‍රිය වෙන්නේ නැහැ. උදාහරණයකට මේ දිනවල විදුලි බිල් ප්‍රශ්නය ගන්න පුළුවන්. බිල අඩුකරන්න කියලා විරෝධතා සංවිධානය කරනවා. නමුත් මේකට විසඳුම මොක්කද? සහන මිළකට විදුලිය දෙන්න නම් රජයට, විදුලිබල මණ්ඩලයට වෙන පාඩුව දරන්න වෙනවා. ඒකට බදු ආදායම් යොදවන්න වෙනවා. බදු ආදායම්, පාඩු ලබන ආයතන නඩත්තු කිරීමට යෙදවීමෙන් රජයේ අනෙක් වැඩක් කරගන්න බැරි වෙනවා. ඒ බැරි වෙනකොටත් මිනිස්සුන්ව පාරට ගේනවා. බදු ආදායම් වැඩි කරගැනීමේ අවස්ථාත් සීමිතයි. ඒවාටත් බරපතල විරෝධතා එනවා. මේ වෙලාවේ විදුලිය නිශ්පාදන වියදම අඩුකරන්න බැහැ. ඒවාට ක්‍රම තිබෙනවා නමුත් ඒවා දීර්ඝ කාලීන වැඩ, නැතිනම් විශාල විදේශ ආයෝජකයන් ගෙන්නලා කරලා කරන්න වෙන වැඩ. ඒත් ආයෝජන ගේන කොටත් ඒවාට විරුද්ධ වෙනවා. ඊළඟට මණ්ඩලයේ දූෂණ වංචා නාස්තිය අකාර්යක්ෂමතා වලක්වන්න ක්‍රමවේද හදනකොටත් වෘත්තීය සමිති මට්ටමෙන් හරි විරෝධයන් එනවා. මේ නිසා විපක්ෂ කට්ටිය කියන විදිහට විදුලි බිල අඩු කරන්න පහසු නැහැ. මේක පීඩාවට පත්වෙලා ඉන්න ජනතාවත් තේරුම් ගන්න ඕන. විශේෂයෙන්ම රට ඇද වැටිලා තියෙන ආර්ථික අර්බුදය නිසා මේ තත්වයන් තවත් සංකීර්ණයි. මේ නිසා විරෝධතා සටන් පාඨ ජනප්‍රිය කරන්න පුළුවන් වුණත් විසඳුම් ජනප්‍රිය වෙන්නේ නැහැ. පළමු කාරණය මොන දේ කරන්නත් රට දෙපයින් සිටවා ගන්න වෙනවා. බංකොලොත් භාවයෙන් මුදවලා ආපහු සංවර්ධනයේ මාර්ග යට ගන්න වෙනවා. නමුත් මේ ජනප්‍රිය සටන් පාඨ ඒවාට උදව් කරන්නේ නැහැ. මේක විපක්ෂ නොදන්නවාම නොවෙයි. දැනගෙන නොදන්නවා වගේ ඉන්නවා. මොකද එයාලට වැදගත් බලය අත්පත් කරගැනීමම පමණක් නිසා. වසර පහකට ලැබෙන බලය තුළ මොකක් හෝ ගැලවිජ්ජාවන් පෙන්නලා කරලා, ඒ සීමාසහිත පැවැතීම් කාලය නඩත්තු කරගත්තාම එයාලට ප්‍රමාණවත්. සමහර විපක්ෂ නායකයොත් දැන් මේක කියන්න පටන් අරගෙන තියෙනවා, **"මාව ජනාධිපති කරලා බලන්නකෝ... අවුලක් වුණත් අවුරුදු පහනේ"** කියලා. එතරම්ම වගකීම් විරහිත පහත් තැනකට මෙයාලා වැටිලා තියෙන්නේ. ජනතාව කියන්නේ කවුරු කියලා හිතාගෙන ඉන්නවද දන්නේ නැහැ. අඩුම තරමින් අවුරුදු පහකට බලය දුන්න ගෝඨාභයට අවුරුදු දෙක වෙනකොට දේශපාලන බලය නෙවෙයි ජීවිත බේරාගන්න පැනලා දුවන්න සිද්ධ වුණා කියන එකත් අමතක වෙලා. මෙහෙම විපක්ෂයකින් ඇත්තටම රටට වෙනසක් බලාපොරොත්තු වෙන්න බැහැ කියන එක පැහැදිලියි. සාම්ප්‍රදායික දේශපාලනයෙන් වෙනස්ව රට ගැන ජනතාව ගැන වගකීම් සහගතව කල්පනා කරලා ඇත්ත ප්‍රශ්නවලට ඇත්ත උත්තර හොයන්න බැරි, ඒ වෙනුවෙන් වෙනස් වෙන්න සූදානමක් නැති පිරිසකට රට වැටිලා තියෙන ජරාජීර්ණත්වයෙන් ගලවලා ඒක හදන්න බැහැ.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ, මේ රටේ බල දේශපාලනයේ සාම්ප්‍රදායිකත්වයෙන් වෙනස් වෙන්නේ මෙතැනදී. රනිල් වෙනස් වුණේ මොකටද කියන එක වැදගත්. ඒ තමන්ගේ බලය රැකගන්න ද? ආණ්ඩුවක් රැකගන්න ද? රාජපක්ෂලාව රකින්න ද? එජාපය ආපහු බලයට ගේන්න ද? නැහැ. එහෙම කළ යුතු නම් රනිල්ගේ වෙනස් වීම වැරදි තීන්දුවක්.

රනිල්ව පාර්ලිමේන්තුව විසින් බහුතර ඡන්දයෙන් රටේ ජනාධිපතිවරයා විදිහට පත් කරනකොට මේ ධුරය තිබුණේ ඉතිහාසයේ බලගතුම විධායක බලය සහිත ජනාධිපති ධුරය විදිටහ. කලින් මෛත්‍රීපාල සිරිසේන යුගයේදී 19වන සංශෝධනය ගෙනවිත් බලතල අඩු කිරීම කර තිබුණා. ඒ විතරක් නෙවෙයි. ඉන් අනතුරුව බලයට පත්වෙන ජනාධිපතිවරයාගේ බලතල තවදුරටත් අඩු වීමට නියමිත ප්‍රතිපාදන පනවලා තිබුණා. නමුත් ගෝඨාභය කළේ 19 අහෝසි කර 20 වන සංශෝධනය ගෙනත් විශාල බලතල ප්‍රමාණයක් ආපහු අත්පත් කරගැනීම. රනිල්ට ඒ බලතල ඒ විදිහටම පාවිච්චි කිරීම කළ හැකිව තිබුණා. තමන් ගැන හිතුවා නම්, තමන්ගේ දේශපාලනික වුවමණාවන් ගැන හිතුවා නම් ඉතිරි කාලය මේ විධායක බලතල සමඟ සෙල්ලම් කරමින් යහමින් ඉන්න පුළුවන්කම තිබුණා. ව්‍යවස්ථාව ඇතැඹුලක් කරගත්ත රනිල්ට තව සෙල්ලම් ගොඩක් දාන්න තරම් පරිචයකුත් තිබුණා. නමුත් එහෙම කළේ නැහැ. රනිල් වෙනස් වුණා. 21 වැනි සංශෝධනය ගෙනත් තමන්ගේ පාලන කාලය තුළම බලතල අඩු කරගැනීම කළා. පාර්ලිමේන්තුව ආණ්ඩුකරණය ගැන තීන්දු ගන්න තැනක් බවට පත් කළා. තමන්ට සෘජුවම ගත හැකි තීන්දුත් පාර්ලිමේන්තුවට දාලා එතැන අනුමැතිය ගන්න තැනට පත් කළා. පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය ශක්තිමත් කර තවත් පුළුල් කළා. රජයේ තීන්දු තීරණ ක්‍රියාත්මක විය යුතු ආකාරය ගැන නිර්දේශ නිගමන ගත්තා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒ තීරණ ගැනීමේ බලය පවා දීලා තියෙන්නේ. පාර්ලිමේන්තුවේ ජාතික සභාව ගොඩනගලා වඩාත් තීරණාත්මක කාර්යභාරයක් විපක්ෂයට පවරලා තියෙනවා. ආංශික කමිටු මඟින් පසුපෙළ මන්ත්‍රීවරුන්ට සහ රටේ තාරුණ්‍යයට එකතු වී ආණ්ඩුකරණය ගැන නිර්දේශ ඉදිරිපත් කරන්න ඉඩ දුන්නා. දැනට කෙටුම්පත් කරල තියෙන ජනසභා ක්‍රමය ක්‍රියාත්මක වෙනකොට රටේ සමස්ත ජනතාවටම ආණ්ඩුකරණයට තවත් සමීප වෙන්න පුළුවන්. ජනතාව, රජය කළ යුතු දේ එතකොට තීරණය කරයි. ලංකාවේ දේශපාලන ඉතිහාසයේ සිදු වුණ වඩාත්ම ඉදිරිගාමී දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තමයි අද මේ සිදු වෙමින් පවතින්නේ. මේවා මෙහෙම වෙන්නේ රනිල් වෙනස් වුණ හින්දා. ඒ රටත් ජනතාවත් ජයග්‍රහණය දක්වා ඔසවා තැබීම වෙනුවෙන්. සාමූහික සහභාගිත්වයක්, සාමූහික ක්‍රියාදාමයක් අනුව රටේ අභිවෘද්ධිය ළඟාකරගන්න. මේ වෙනස සාම්ප්‍රදායික පක්ෂ බල දේශපාලනයෙන් වෙනස් වුණ අතිශය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයක්. ලෝකයටම යහපාලනයේ ආදර්ශය පෙන්වා දෙන ක්‍රියාවලියක්. තමන් වෙනස් වීමෙන් ලෝකය වෙනස් කළ හැකියි කියන්නේ මෙහෙම දේවල්වලට.

රනිල්ට පුළුවන් වුණා තමන් වෙතින් නැතිනම් තමනුත් සම්බන්ධ වෙලා හිටපු පැරණි දේශපාලනය නිසා රටට වෙච්ච හානිය පිළිගන්න. එදා කළේ පවතින විදිහට ගැලපෙන දේශපාලනයක්. ජනප්‍රිය දේශපාලනයක්. බලය අරගෙන වෙනස් වෙමු කියන සරළ සටන් පාඨ දේශපාලනයක්. නමුත් ඒ කරලා වෙච්ච වැරද්ද රනිල් අද පිළි අරගෙන තියෙන්නේ. රට බංකොලොත් වුණේ එතැනින් කියන එක රනිල් පෙන්වලා දීලා තියෙනවා. නමුත් විපක්ෂය තාම ඒක පිළිගන්නේ නැහැ. තාම යෝජනා කරන්නේ පරණ විදිහ. ඉතිං ඒ පරණ අතීතය තවත් අවශ්‍ය නැහැ. තවත් පරණ විදිහට ඉස්සරහට යන්න බැහැ. දැන් හිතන්න ඕන අනාගතය ගැන. වැරද්ද නිවැරදි කරගනිමින් යන අලුත් වෙනස් පාරක් ගැන. රනිල් වෙනස් වෙන්නේ රටත් ජනතාවත් ඒ පාරේ රැගෙන යන්න. ඒ තමන් වෙනුවෙන් නොවෙයි.

ජයතුංග බණ්ඩාර

# ගාස්තු වැඩිවීම සාධාරණීකරණය කරන්න පුළුවන්ද?




## විදුලිබල හා බලශක්ති අමාත්‍ය කංචන විජේසේකර

රජය මේ වසරේ පෙබරවාරි මාසයේදී ගාස්තු සියයට 66කින් වැඩි කළත් ජූලි මාසයේදී එය සියයට 14කින් අඩු කළා. රජයට අයත් ලංකා විදුලිබල මණ්ඩලය (CEB) පසුගිය වසරේ අගෝස්තු මාසයේදී ගාස්තුව සියයට 50කට වඩා වැඩි කළා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසිවලට අනුකූලව, විදුලිබල මණ්ඩලයට අතීතයේ මෙන් භාණ්ඩාගාර මූල්‍ය මත යැපෙන්න බැහැ. ඒ නිසා ලංවිමට පාඩුවක් කරන්න බැහැ.

ඩොලර් බිලියන 3ක ණය වැඩසටහනක් සඳහා ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට (IMF) විදුලිය සහ ඉන්ධන සඳහා පිරිවැය පිළිබිඹු මිල ප්‍රතිපත්තියක් සඳහා කැපවී සිටිනවා. වැඩසටහනේ දෙවන වාරිකය ලෙස තවත් ඩොලර් මිලියන 330ක් බෙදාහැරීමේ පියවරක් ලෙස පසුගිය සතියේ කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමක් අවසන් කළා.

අනාගතයේදී තීරුබදු අඩු කිරීම සඳහා තවත් බලශක්ති උත්පාදන බලාගාර ඇති කිරීමට රටට වැඩි අරමුදල් අවශ්‍යයි. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව (ADB), Asian Infrastructure Investment Bank (AIIB) Japan International Cooperation Agency වැනි බහුපාර්ශ්වික ණය දෙන ආයතන වන JICA, සහ USAID රටට උදව් කිරීමට බලා සිටිනවා. ඕනෑම කෙනෙකුට මෙහි ආයෝජනය කිරීමට නම්, අපට පිරිවැය පරාවර්තික මිලකරණ ප්‍රතිපත්තියක් තිබිය යුතුයි. ශ්‍රී ලංකාවට මෙම අරමුදල් වෙත ප්‍රවේශ විය හැක්කේ අප ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්තිවලට අනුව ගිය විටයි.

ලංවිම ජූලි මාසයේදී සියයට 3ක තීරුබදු කප්පාදුවක් ඉල්ලා සිටි නමුත් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සියයට 14ක ගාස්තු සංශෝධනයක් ලබාදී තිබෙනවා. මිල වැඩිවීම හරහා අපි උත්සාහ කරන්නේ, අඩු ආදායම්ලාභී පිරිසට මේ වසරේ ඇස්තමේන්තුගත පාඩුව බිලියන 18ක් ලබාදීමටයි. නැතිනම් බදු ගෙවන්නන්ගේ මුදලින් මේ මුදල් දරන්න වෙනවා. සැප්තැම්බර් අග වන විට ලංවිම මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 29.05 ක් වී ඇති අතර IMF කොන්දේසිවලට අනුව භාණ්ඩාගාරයට ලංවිමට මුදල් යෙදවීමට නොහැකි බැවින් එය පාරිභෝගිකයන්ගෙන් අයකරගත යුතුයි.

අධික වර්ෂාපතනයක් පැවතියද ජල පෝෂක ප්‍රදේශවලට වර්ෂාපතනයක් නොලැබීම හේතුවෙන් පසුගිය වසරේ එම දිනයට සාපේක්ෂව මේ වසරේ ඔක්තෝබර් 22 වැනිදා වන විට විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය ජල ධාරිතාව සියයට 20කින් අඩුවීමට හේතුවී තිබෙනවා. පවතින දත්ත පෙන්වා දෙන්නේ මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල නියඟයක් ඇති විය හැකි අතර එය ඔක්තෝබර් දක්වා පැවතිය හැකි බවයි. 2024 දී දිගු නියඟයක් ඇති වීමට නියමිතව තිබෙනවා. මිනිසුන්ට මෙය දැනෙන්නේ මිල වැඩි කිරීම ක්‍රමයෙන් සිදු නොවූ නිසා සහ ජූලි මාසයේ 14 කප්පාදුව නිසයි.

ඉදිරි වසර 06 තුළ සූර්ය පැනල සවිකර මෙගාවොට් 4000ක විදුලිය නිපදවීම සඳහා ඉඩම් අක්කර 14,000ක් නම් කිරීමට තම අමාත්‍යාංශය අපේක්ෂා කරනවා.

රජයේ සහ පෞද්ගලික අංශයෙන් ඉඩම් වෙන්කර ටෙන්ඩර් පටිපාටියට පසුව කටයුතු කිරීමට අමාත්‍යාංශය බලාපොරොත්තු වනවා. ඒ අනුව සූර්ය බලශක්තිය භාවිතයෙන් මෙගාවොට් 4000ක විදුලිය නිපදවීම සඳහා ඉඩම් අක්කර 12,000ක් වෙන් කිරීමට අමාත්‍යාංශය සැලසුම් කලා.

මෙගාවොට් 1000ක සුළං විදුලිය නිෂ්පාදනය සඳහා තවත් ඉඩම් අක්කර 2000ක් වෙන් කෙරෙනවා. සම්පූර්ණයෙන් මෙගාවොට් පැය 4000ක විදුලිය ජනනය කෙරෙන අතර එය ඉදිරි වසර හය සඳහා ප්‍රමාණවත්.

මේ වසර අවසන් වන විට වහලය මත සවිකෙරෙන සූර්ය පැනල මගින් මෙගාවොට් 150කට වැඩි විදුලියක් ජනනය කිරීමට අමාත්‍යාංශය බලාපොරොත්තු වනවා. ඉදිරි සති දෙක තුළ සමනලවැව ජලාශයේ මෙගාවොට් 200ක් නිපදවීමට පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීමට අදාළ යෝජනාව සළකා බැලීමට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය කටයුතු කරනවා.




# කඳුකර ජනතාවගේ මෙහෙවර සම්බන්ධයෙන් ගෙන ඇති පියවර මොනවද?

## ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය ජීවන් තොන්ඩමන්

කඳුකර ජනතාව මෙරටට පැමිණ වසර 200ක් පිරීම නිමිත්තෙන් නොවැම්බර් 2 වැනිදා "නාම් 200" (අපි 200) නමින් සැමරුම් උත්සවයක් සංවිධානය කර තිබෙනවා. මෙහිදී කඳුකර ජනතාව ජාතියට සිදු කළ මෙහෙවර ඇගයීමට ලක් කෙරෙනවා. ඒ වගේම කඳුකර ප්‍රජාවට ප්‍රතිලාභ සැලසීම අරමුණු කරගනිමින් වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන් රාශියක සක්‍රියව නියැලී සිටිනවා.

පුළුල් පරාසයක පැතිර පවතින ඔවුන්ගේ ගැටලු විසඳීම සඳහා අමාත්‍යාංශය තුළ වතුකරයට විශේෂිත වූ කමිටු හතක් ඇතුළත් ප්‍රඥප්තියක් ද හඳුන්වාදී තිබෙනවා. මෙම කමිටු ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සෞඛ්‍යය, අධ්‍යාපනය, ක්‍රීඩා සහ වෙනත් ක්‍රියාකාරකම් සඳහා කාන්තාවන් සහ ළමුන්ගේ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා.

අදාළ ප්‍රඥප්තිය මගින් සියලු අමාත්‍යාංශ සඳහා පුළුල් මාර්ගෝපදේශයක් සපයනවා. එමගින් කඳුකර ප්‍රජාවගේ සුවිශේෂී ගැටළු විසඳීමට සහ ඔවුන් පසුවන වතුකරයේ හුදකලාව බිඳ දමමින් එම ජනතාව ශ්‍රී ලාංකීය සමාජයට නැවත ඒකාබද්ධ කරන්නේ කෙසේද යන්න පිළිබඳ අවබෝධයක් ලබා දීමට ද නියමිතයි. දළ වශයෙන් 150,000- 200,000 පමණ කම්කරුවන්ගෙන් සමන්විත උඩරට ප්‍රජාව අපට ඉතාමත් වැදගත් වනවා. තවද ඔවුන්ගේ පවුල්වල කොටසක් වන අතිරේක පුද්ගලයින් 800,000 සිට මිලියන 1.2 දක්වා පිරිසක් වතු තුළ වාසය කරනවා.

ඒ වගේ ම කඳුකර ජනතාවගේ සංවර්ධනයට මේ වන විට අයවැයෙන් වෙන් කර තිබෙන්නේ මිලියන 3000ක් පමණයි. නිවාස ව්‍යාපෘති සඳහා මිලියන 2000-2500ක් පමණ වෙන් කෙරෙනවා. ඒ වගේම විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් අපි ඉන්දීය රජය සමඟ සාකච්ඡා කර තිබෙනවා. ඉන්දීය රජය දැනටමත් අපට මිලියන 3000ක් ලබාදී තිබෙනවා. මේ හරහා අපි උත්සාහ කරන්නේ ස්ථිර වෙනස්කම් ඇති කිරීමටයි. විශේෂයෙන්ම මේ සදහා එක්වන ක්‍රියාකාරී කණ්ඩායමේ කිසිදු දේශපාලනඥයකු නොමැති බව සඳහන් කිරීමට කැමතියි. මහාචාර්යවරුන්, විශ්වවිද්‍යාල සිසුන්, සිවිල් සමාජ නියෝජිතයන් ඇතුළු කඳුකරයේ බුද්ධිමතුන් ඇතුළු විශාල පිරිසක් මේ කාර්යයට සම්බන්ධ වෙනවා.

ඔවුන්ගෙන් සැලැස්මේ කෙටුම්පත ලැබුණු පසු අපි එය ඉන්දීය රජයට ඉදිරිපත් කරනවා. ඒ සමඟම කඳුකරය නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ට අපි එය ලබා දෙනවා. ඔවුන්ගේ ප්‍රතිපෝෂණ හා යෝජනා ලබාගෙන එය ක්‍රියාත්මක කිරීමට අපි සැලසුම් කරනවා.

ඒ වගේම ඉන්දීය නිවාස ව්‍යාපෘතිය දැනටමත් ආරම්භ කර තිබෙනවා. මෙවර අපි ඉඩම් 1785ක් එකවර නිදහස් කරන ලෙස කැබිනට් මණ්ඩලයට ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව පළමු අදියරේ දී නිවාස 1300 ක පමණ ඉදිකිරීම සිදු කෙරෙනවා.

# කර්මාන්ත සංවර්ධනයේ ඉදිරිවැඩ පිළිවෙල මොකක්ද?

## කර්මාන්ත හා සෞඛ්‍ය අමාත්‍ය රමේෂ් පතිරණ



විශේෂයෙන්ම අපේ රටේ ආනයන සීමා කිරීම් ක්‍රියාත්මක වූ වකවානුව තුළ ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමට මෙන්ම අපනයනය ඉහළ නැංවීමට ද මෙරට ව්‍යවසායකයින් ඉහළ දායකත්වයක් ලබා දී තිබෙනවා. ඒ හේතුවෙන් 2022 වසර අවසාන වන විට ඉතිහාසයේ වැඩිම අපනයන ආදායම ලෙස ඩොලර් බිලියන 13.1ක් උපයා ගැනීමට හැකි වුණා.

ඒ වගේම ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය ඉතා සීමිතයි. මේ නිසා අපේ රටේ කර්මාන්ත ප්‍රමාණවත් ලෙස දියුණු වී නැහැ. ඒ නිසා මෙම ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමට අප මේ වනවිට පියවර ගනිමින් සිටිනවා. අපේ ඉලක්කය වී තිබෙන්නේ රටේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 1ක් කර්මාන්ත සඳහා වෙන් කිරීමටයි.

මේ වන විටත් ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය (NAPID) සකස් කර අමාත්‍ය මණ්ඩල සඳහා ඉදිරිපත් කර තිබෙනවා. එය ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති රාමුවට (2023-2048) ඇතුලත් කිරීමට ආර්ථික ස්ථායීකරණය පුනර්ජීවන සහ වර්ධනය ඉහළ නැංවීම පිළිබඳ කමිටුව තීරණය කර තිබෙනවා.

කර්මාන්ත ප්‍රතිපත්තියට අදාළ පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම ද සකස් කර අවසන්. එය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අමාත්‍යාංශය විසින් දැනටමත් ආරම්භ කර තිබෙනවා. තවද මෝටර් රථ එකලස් කිරීම සහ මෝටර් රථ උපාංග නිෂ්පාදනයට අදාළ නව ආයතන 15ක් සඳහා 2023 වසරේදී අනුමැතිය ලබා දී තිබෙනවා.

ඒ වගේම අප දැනටමත් නව කර්මාන්තපුර 03 ක් ආරම්භ කිරීමට පියවර ගෙන තිබෙනවා. ඒ කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය, ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය, මහනුවර දිස්ත්‍රික්කයේ පොත්තපිටිය වශයෙන්.

දෙවන අලෙවිය මඟින් සර්කෝන් මෙට්‍රික් ටොන් 30,000ක් වෙනුවෙන් ඇමරිකන් ඩොලර් මිලියන 14.1ක ආදායමක් ලබා ගැනීමට හැකිවුණා. එමඟින් ලැබූ ආදායමෙන් රුපියල් මිලියන 1726ක මුදලක් ලාභාංශ ලෙස භාණ්ඩාගාරයට ලබා දීමට ද අප කටයුතු කළා.

සටහන

අසන්ත බණ්ඩාර

# කොට්ටේ මාරු කළාට සුව වෙයිද සෞඛ්‍යය?

ශ්‍රී ලංකාවේ සෞඛ්‍යය හොඳ වෙන්න නම්, ඇය නිරෝගී විය යුතුය. ඒ නිරෝගිත්වය ඇති වන්නේ ඉන්ද්‍රිය පද්ධතිය අතුරු අන්තරාවක් නොමැතිව නිවැරදිව ක්‍රියාත්මක වේ නම් පමණි. මේ රටේ සෞඛ්‍ය පද්ධතිය කියන්නේ සමස්ත දේහයේ නිරෝගිත්වය වෙනුවෙන් ඇති විශාලම ක්‍රියාකාරිත්වයයි. නමුත් දැන් කාලාන්තරයක් තිස්සේ එය අඩාල වෙමින් රෝගීව ඇඳක් මතට ඇද වැටී තිබෙන්නකි. එක් එක් දොස්තර මහත්වරු ඇවිත් මේ රෝගියාව සුවපත් කිරීමට වෙර දැරුවත් සුවපත් කළ නොහැකි නිධන්ගත රෝගයක් සේ දැඩි සේ අසාධ්‍ය තත්වයේම පවතී.

රෝගියෙකුට බෙහෙත් කළාටම රෝග සුව වන්නේ නැතැයි කියති. ඒ වෙදකම වගේම හෙදකමත් අවශ්‍ය නිසාය. ප්‍රශ්නයට උත්තර තිබුණත් එය හරියට ක්‍රියාත්මක වීමට අවශ්‍ය තත්වයන් නොමැතිව ප්‍රශ්නය නොවිසඳේ කියන්නෙත් මෙහෙම දෙයකි. මේ කතාව දිගැරෙන්නේ ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අභියෝග හමුවේ නව ඇමතිවරයාගේ කාර්යය භාර්යය කවරක් විය යුතු ද යන්න විමසීම උදෙසාය.

## කොට්ට මාරුව සෞඛ්‍යයට විසඳුමද?

හිටපු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිවරයා ලෙස කළ කාර්යය සම්බන්ධයෙන් විවිධ පාර්ශ්වයන්ගේ බලවත් විරෝධයන් ගණනාවක් එල්ල වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පසුගියදා විශ්වාසභංග යෝජනාවක්ද පාර්ලිමේන්තුව හමුවට ගෙනවිත් තිබිණි. ඒ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විවිධ වූ අර්බුදයන් සම්බන්ධයෙන් ඇමතිවරයාගේ මැදිහත්වීමේ දුර්වලතාවයන් පෙන්නුම් කරමිනි. එහෙත් විශ්වාසභංගය විපක්ෂය පරාජය ලබා ඇමතිවරයා ජයග්‍රණය කළේය. මෙතෙක් පාර්ලිමේන්තුවේ විශ්වාසභංගයන්ට සිදු වූ ඉරණමම මෙයට උරුමවීම සාමාන්‍යයක් විය. එහෙත් විපක්ෂය විශ්වාසභංගය නිසි ලෙස ගෙන ආවේ නම් පරාජය විය යුතුව තිබුණේ සෞඛ්‍ය ඇමතිවරයා නොව ලංකාවේ සෞඛ්‍යය පද්ධතියේ දුර්වලතාවයන් සහ ඊට විනකටින විවිධ වූ ජාවාරම්කාර පාර්ශ්වයන්ය. හැමදාමත් වගේ විපක්ෂය ෆේල් වන්නේ සඳ පෙන්නූ පසු සඳ දෙස නොබලා ඇඟිල්ල දෙස බැලීමේ මෝඩකම නිසාය. ඇත්ත ප්‍රශ්නය වෙනුවට හුදු දේශපාලනික වුවමණාවක් ජයගැනීමට විපක්ෂයට අවශ්‍යව තිබිණි. ඒ අනුව එය පරාජය කිරීමට ආණ්ඩු පක්ෂය කල්පනා කිරීම වැරදි නැත.

කෙසේ නමුත් ඇතිව තිබු තත්වයන් හමුවේ සෞඛ්‍ය අමාත්‍ය ධූරයේ වගකීම වෙනස් කිරීමට ජනාධිපතිවරයා පසුගියදා කටයුතු කළේය. වෛද්‍යවරයෙකු ලෙස කටයුතු කරමින් සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් හසල දැනුමක් හා ප්‍රායෝගික ක්‍රියාදාමයක නියැලුන අයෙකු සහ ජනප්‍රිය දේශපාලනඥයකු මෙන්ම කර්මාන්ත ඇමැති ධූරය සාර්ථකව මෙහෙයවමින් සිටින රමේෂ් පතිරණ වෙත මෙම වගකීම පවරා තිබිණි. කොහොම නමුත් මේ වන විට අභියෝගාත්මකව තිබෙන මෙම ක්ෂේත්‍රයේ ගැටළු විසඳා ගැනීම ඔහු සතු වගකීම වෙයි. කෙසේ නමුත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම වෛද්‍ය විද්‍යාත්මක කරුණයක් නොවේ. ඊට වඩා එහා ගිය දේශපාලන ආර්ථික පරිචයක් හා රාජ්‍ය පරිපාලනය ගැන ඉහළ අවබෝධයද තිබිය යුතුය. එපමණක් නොවේ අද සෞඛ්‍ය ක්ෂේත්‍රය අරක් ගෙන තිබෙන දොස්තර වෘත්තීය සමිති මාෆියාව මෙන්ම ඖෂධ ජාවාරම්කාරයන්ගේ තර්ජනයන්ද පරාජය කිරීමට සමත් විය යුතුය. එමෙන්ම වත්මන් ආර්ථික අර්බුද හමුවේ රට මුහුණ දෙන ගැටළුව නිරාකරණය කරගැනීමට රජය දරන වෑයම සමඟ සමගාමීව මේ කටයුත්ත වඩාත් දුෂ්කර තත්වයන් යටතේ ඉටු කිරීමට සිදුව ඇත. මේ අනුව මෙම වගකීම භාර ගැනීමට රමේෂ් පතිරණ තීරණය කිරීමත් ඔහු ඔහුටම කර ගත් අභියෝගයක් ලෙසද සැලකිය හැකිය. මන්ද මෙහිදී අසමත් වීම ඔහුගේ



දේශපාලන ජීවිතයට ප්‍රබල පහරක් වීම වැලැක්විය හැකි නොවන නිසාය. ඔළුවේ අමාරුවට කොට්ටය මාරු කිරීමක් වුණා සේ මෙම ඇමැති මාරුව නොවුණු බවට ඔහු වගබලා ගත යුතුය.

## සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පරිපාලන අසනීපය

කවර ඇමතිවරයෙකු යටතේ හෝ රාජ්‍ය සේවයේ නිතර නිලධාරී පැලැන්තිය කටයුතු කරන ආකාරය අනුව එම විෂයේ ප්‍රායෝගික සඵලතාවයන් හෝ දුබලතාවයන් පෙන්නුම් කිරීම සාමාන්‍යයය. මෙය සෞඛ්‍ය ක්ෂේත්‍රයේදී සුවිශේෂී වන්නේ එම විෂය පථය අනිවාර්යය ලෙස මිනිස් ජීවිතයේ මූලික අවශ්‍යතාවයන් සමඟ බැඳී පවැතීම හේතුවෙනි. ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය වෙනත් විෂයන්ට සාපේක්ෂව නිරන්තරයෙන් කතා බහට ලක්වන්නේ ඊට වැඩි වැදගත්කමක් සහිතවය. වෛද්‍ය වෘත්තිය, හෙද වෘත්තිය, වෙනත් වෛද්‍ය සහයක සේවා වෘත්තිය, ඖෂධ ගෙන්වීම් බෙදාහැරීම්, ප්‍රසම්පාදන නිලධාරීන්, පරිපාලන වැනි නිලධාරී ජාලාවන් යටතේ ක්‍රියාත්මක වන සෞඛ්‍යය මේ එකදු බිඳ වැටීමකදී වුව සමස්තය වෙත ප්‍රේරණය කරන ගැටළුව දැවැන්තය. ඒ අවබෝධය මත මේ වෘත්තිකයන් මීට ආදළ වෘත්තීය සමිති අටවා ගැනීමෙන් තමන්ගේ රාජකාරියේ ප්‍රමාණය හෝ අගය වැඩි කරගැනීමට ඕනෑම මොහොතක සෞඛ්‍යය නමැති රෝගියාගේ සෞඛ්‍යය තත්වය තමන්ට රිසි පරිදි පවත්වා ගැනීමට ප්‍රයත්න දැරීම සිදුවෙයි.

වෛද්‍යවරුන්ගේ වැටුප් අර්බුදයන් තවමත් නතර වී නොමැත. එය ඕනෑම මොහොතක බරපතල ගණයේ වැඩ වර්ජනයන් රෝගින් බිල්ලට දී හෝ සිදුකිරීමට තරම් බලසම්පන්නව ක්‍රියාත්මක වෙමින් පවතී. හෙද සේවාව මීට දෙවැනි නැත. රාජකාරිය කවරක වුවද රාජකාරියට අදාල අයිතිවාසිකම් ලබාදීමට රට කවර තත්වයක් තුළ වුවද රජය ක්‍රියාත්මක විය යුතුය. එසේ නොමැති තත්වයන් තුළ මහා වැඩවර්ජන පවත්වන්නේ රෝගීන්ගේ ජීවිත තඹ සතයකට මායිම් නොකරය. සෞඛ්‍ය සැපයුම් හා ඖෂධ නියාමනයන් මෙන්ම බෙදාහැරීම්හි තත්වයන්ද මෙසේමය. මේ සෑම වෘත්තීය ක්ෂේත්‍රයක් ඕනෑම මොහොත අඩපන කර දැමීමට තරම් එහි වන වෘත්තිය සමිති ජාලාවන් සැහැසිය. මේ නිසාම ඇමතිවරයා කවරෙක් වුවද මේ පරිපාලන පද්ධතියේ ඇති අර්බුදය විසඳාගැනීම නොකර ඉදිරියට යෑමක් වන්නේ නැත.

## ඖෂධ ජාවාරම

පසුගිය කාලය තුළ සිදුවූ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටළු සිදුවන්නේ මෙකී අංශයන්ගේ දුර්වලතාවයන් පදනම් කොට ගෙනය. උදාහරණයක් ලෙස අප පසුගිය ලිපියක දැක් වූ පරිදි ඇමතිවරයාට එරෙහි විශ්වාසභංගයේ ඍජු චෝදනාවක් එල්ල වන එන්නත් විෂ වීම ගැන ගැටළුවේදී ඊට මේ සියලු අංශයන්හි දුර්වල ක්‍රියාකාරීත්වය බල පැවැත්විය. එය ඇමැතිවරයාට ඍජුව වලක්වා ගත හැකි සීමාවන් ඉක්මවා ගිය තත්වයක් බව පෙන්නුම් කර තිබිණි. මෙය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පරිපාලනය සම්පූර්ණ වගකීම් සහගත ක්‍රියාවලියක නොපිහිටීම හේතුවෙන් සිදු වූවකි. ආණ්ඩුවේ දේශපාලන ක්‍රියාදාමයේ අඩුවක් මීට බලපෑවා නම් ඒ දැඩි තීන්දු තීරණ ගෙන මේ ජාවාරම්කාරී තත්වයන් පාලනය කිරීමට අසමත් වීමය. නමුත් එසේ කිරීමද පහසු නැත. ජාවාරම්කරුවෝ මර්දනය කරන විට රිදෙන්නේ බොහෝ විට වෘත්තීය සමිති නායකයන්ට නිසා එහි ප්‍රතිපලය විය හැක්කේ වැඩවර්ජනයන්ය. නැතිනම් රට පුරා ඖෂධ හිඟයන් ගැන මාධ්‍ය ප්‍රචාරණයන් ඔස්සේ සිදුවන ආණ්ඩු විරෝධයන්ය. රෝගීන්ව පාරට බැස්සවීමය. ඒ නිසා සෞඛ්‍ය පරිපාලනමය ක්ෂේත්‍රය සම්බන්ධව ඇති ගැටළු විසඳීම අතිශය උපක්‍රමික පියවරක්ව තිබේ. නව ඇමති වේවා පරණ ඇමති වේවා මෙකී සෞඛ්‍ය අනුවිෂයන් කළමනාකරණය කරගැනීමට හෝ නව වෙනස්කම් ඇති කිරීම දක්වා තම වගකීම මෙහෙය නොවන්නේ නම් තත්වයන් දරුණුවීමට ගත වන කාලය බොහෝ අඩු විය හැකිය.

මේ අනුව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවධානම් සහගතම රෝගී තත්වය වන්නේ ඖෂධ ජාවාරමය. ඖෂධ මිලදී ගැනීම බෙදාහැරීම, යන වගකීම් සහගත ක්‍රියාවලිය හරි හැටි නොවන්නේ නම් ඕනෑම මොහොතක සෞඛ්‍යය නමැති රෝගියා දැඩි සත්කාර ඒකකයට ඇතුලත් කළ හැකිය.

ඖෂධ ජාවාරමේ පරිමාණයන් මෙතකැයි කීමට නොහැකි තරමේ අතිශය සියුම් තැන් පවා ආක්‍රමණය කළ පිළිකාවක්ව තිබේ. මේ තත්වයන් යටතේ සෞඛ්‍ය ඇමතිවරයාට පවා පාරිශුද්ධවීමට නොහැකි වන බව මෙතෙක් අත්විදි තත්වයය. එයට බලපානුයේ ඒ තරම් දරුණුවට ලෝකයේ ජාවාරම් අතර ප්‍රමුඛ පෙළේ ජාවාරමක් බවට ඖෂධ ජාවාරම පත්ව තිබීමය. මෙය ඩොලර් බිලියන් ගණනින් වන ජාත්‍යන්තර ජාවාරමකි. රටේ වගකිව යුතු තැන් අල්ලා ගැනීම මෙහි ස්වභාවය සහ ඊට ඇති පහසු හැකියාවක්ද ඇත. මේ තත්වය අනිවාර්යයෙන්ම නව ඇමතිවරයාටත් අභියෝගයක් වනු ඇත. නව ඇමැතිවරයා එලෙස දූෂණයට යටත් නොවෙන්නෙකුය යනුවෙන් බෝඩ් ලෑල්ලක් එල්ලීමට හදිසි නොවන්නේ නියමයෙන් හෝ අනියමයෙන් මේ තරම් සූක්ෂම ජාවාරමකින් ගැලවී සිටීමට

මෙය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පරිපාලනය සම්පූර්ණ වගකීම් සහගත ක්‍රියාවලියක නොපිහිටීම හේතුවෙන් සිදු වූවකි. ආණ්ඩුවේ දේශපාලන ක්‍රියාදාමයේ අඩුවක් මීට බලපෑවා නම් ඒ දැඩි තීන්දු තීරණ ගෙන මේ ජාවාරම්කාරී තත්වයන් පාලනය කිරීමට අසමත් වීමය. නමුත් එසේ කිරීමද පහසු නැත. ජාවාරම්කරුවෝ මර්දනය කරන විට රිදෙන්නේ බොහෝ විට වෘත්තීය සමිති නායකයන්ට නිසා එහි ප්‍රතිපලය විය හැක්කේ වැඩවර්ජනයන්ය. නැතිනම් රට පුරා ඖෂධ හිඟයන් ගැන මාධ්‍ය ප්‍රචාරණයන් ඔස්සේ සිදුවන ආණ්ඩු විරෝධයන්ය. රෝගීන්ව පාරට බැස්සවීමය. ඒ නිසා සෞඛ්‍ය පරිපාලනමය ක්ෂේත්‍රය සම්බන්ධව ඇති ගැටළු විසඳීම අතිශය උපක්‍රමික පියවරක්ව තිබේ. නව ඇමති වේවා පරණ ඇමති වේවා මෙකී සෞඛ්‍ය අනුවිෂයන් කළමනාකරණය කරගැනීමට හෝ නව වෙනස්කම් ඇති කිරීම දක්වා තම වගකීම මෙහෙය නොවන්නේ නම් තත්වයන් දරුණුවීමට ගත වන කාලය බොහෝ අඩු විය හැකිය.

දේශපාලන අධිකාරය දරන්නකුට ඇති හැකියාව සීමිත නිසාය. විශේෂයෙන්ම මෙරට පසුගිය අත්දැකීම් අනුව එලෙස සිතීම සාධාරණය. මේ වන විට අල්ලස් හෝ දූෂණ වැලැක්වීම, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයෙන් යුතුව සිදුකිරීම, රාජ්‍ය මූල්‍ය විනය ආදිය සම්බන්ධයෙන් රජය ගෙන තිබෙන පියවරයන් අනුව සුබ බලාපොරොත්තු තැබිය හැකි වුවද කලින් කීවාක් මෙන්ම රෝගියාට වෙදකම පමණක් නොව හෙදකමද හරියට සිදු වීම විය යුතුය. ඇමතිවරයා මේ හෙදකම හරියට කළ යුතුය.

නව සෞඛ්‍ය ඇමතිවරයා හමුවේ ඇති අභියෝග සුළුපටු නැත. ඔහුට මේ සියල්ල ජය ගැනීමට හැකි වෙනු ඇතැයි ප්‍රායෝගිකව කල්පනා කිරීමට අපහසු වුවත් අනාගතයේ යම් කාලයකදී ලංකාවේ සෞඛ්‍යය නීරෝගී තැනකට ගොඩ නැගෙන්නේද අද ගන්නා පියවරයන් අනුවය. මේ සියලු ක්ෂේත්‍රයන් මනාව කළමණාකරණය කොට පද්ධතියේම් වෙනසක් වෙනුවෙන් නව සෞඛ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රමවේදයක් දක්වා පාර කැපීමට උත්සුක වන්නේ නම් එය මේ මොහොතේ සිදුවිය යුතුම යුගයේ කාර්යය භාර්යය වනු ඇත. ඒ අනුව මෙරට සෞඛ්‍ය පද්ධතිය නිවැරදිව සකස් වීම ඇමතිවරයාගේ සහ රජයේ දේශපාලන සෞඛ්‍යයටද රටේ ආර්ථික සෞඛ්‍යයටද උදක්ම මහෝපකාරී වනු ඇති බව සටහන් කොට තබමු.

කේ.පී.අයි. ප්‍රියංගනී

# ශක්තිමත් එක්සත් මහාද්වීපයක් සඳහා ජනපතිගේ දැක්ම

ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ මෑත කාලීන ජාත්‍යන්තර මෙහෙයුම් මෙරට ඇතැම් පාර්ශ්වයන් වටහාගෙන ඇත්තේ ජාත්‍යන්තරය තරහා කරගැනීමක් ලෙසය. රටේ ප්‍රධාන විපක්ෂය පවා තේරුම් ගෙන ඇත්තේ එලෙසය. කොහොම නමුත් ජනාධිපතිවරයාගේ ක්‍රියාකාරීත්වය අද ජාත්‍යන්තරය විසින්ම ඉල්ලා සිටින තත්වයකට පත්ව ඇත.

ඒ අනුව මෑත මාස කිහිපය තුළ ජනාධිපති රනිල් වික්‍රමසිංහ ආසියාවේ වඩාත්ම දැවෙන අභියෝග සම්බන්ධයෙන් අපේක්ෂා සහගත විසඳුම් සඳහා වන අත්‍යාවශ්‍ය උපදේශකයෙකු ලෙස මතුවෙමින් සිටී. නමුත් එය අසාමාන්‍ය දෙයක් නොවේ. ජාත්‍යන්තර සංසදවලදී ඔහු ඉදිරිපත් කළ දේශන හරහා සමස්ත ආසියානු මහාද්වීපයේ ස්ථාවරත්වයට තර්ජනයක් වන දේශගුණික විපර්යාස, ආර්ථික කැළඹීම් සහ ගෝලීය ගැටුම් ඇතුළු අපේ කාලයේ තීරණාත්මක ගැටලු විසඳීම සඳහා කලාපීය සහයෝගීතාව සඳහා දූරදර්ශී සැලැස්මක් එළිදක්වා තිබේ.

## ප්‍රායෝගික ප්‍රතිසංස්කරණවාදියෙකුගේ විසඳුම්

මාස ගණනක ආර්ථික හා දේශපාලන පෙරළියක් මධ්‍යයේ 2022 ජූලි මාසයේදී ජනාධිපති ධුරයට පත් වූ රනිල් වික්‍රමසිංහ අභියෝගාත්මක එහෙත් අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ මාලාවක් හරහා ජාතියේ ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීමට කැපවී සිටී. ජනාධිපති සහ මුදල් ඇමති ලෙස ඔහුගේ ද්විත්ව භූමිකාව තුළ, දැඩි තීරණ ගැනීමට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබාගැනීමට සහ ණය හිමි ජාතීන් සමඟ නැවත සාකච්ඡා ආරම්භ කිරීමට ඔහුට බල කෙරිණි. ඉතාමත් අහිතකර තත්වයන් තුළ පවා ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ලබා දිය හැකි ප්‍රායෝගික ප්‍රතිසංස්කරණවාදියෙකු ලෙස මෙම අත්දැකීම ඔහුගේ කලාපීය දැක්මට යටත්ය.

ජනාධිපති වික්‍රමසිංහ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරය අමතා මෑතදී කළ දේශනය අතරතුර, දේශගුණික විපර්යාසවල සිට ගෝලීය සැපයුම්දාමයට බාධා කරන ගැටුම් සහ ඉන්ධන මිළ ඉහළ යෑම දක්වා පැතිර යන ගෝලීය අර්බුද පිළිබඳ සියුම් ඇගයීමක් ඉදිරිපත් කළේය. එසේ වුවද, ඔහුගේ ස්ථාවරය නොසැලී විසඳුම් මත පදනම් විය. ඔහු ශ්‍රී ලංකාවේ දේශීය දේශගුණික ක්‍රියාකාරී සැලසුම් ගෙනහැර දැක්වූවා පමණක් නොව ජාත්‍යන්තර දේශගුණික විපර්යාස විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සඳහා යෝජනා ද ඉදිරිපත් කළේය. තනිව ගැටලු විසඳන නායකයන්ට වඩා හාත්පසින්ම වෙනස්ව, ක්‍රියාකාරී විසඳුම් වටා සම්මුතියක් ඇති කරගැනීමට ජනාධිපති වික්‍රමසිංහ අවිවාදයෙන්ම කැපවී සිටී. ඔහු සූක්ෂම ලෙස පෙන්වා දුන් පරිදි, "**අප ඉදිරියේ ඇති ප්‍රශ්නය යුද්ධයට වගකිව යුතු පාර්ශ්වය සොයාගැනීම නොව, යුද්ධය අවසන් කරන පාර්ශ්වය සොයා ගැනීමයි**" යන්න සියළු දෙනාගෙම අවධානයට යොමු විය. මෙරට සම්බන්ධ අර්බුදයේදීද ඔහු ගත් ස්ථාවරය එය විය.

මෙම ප්‍රායෝගික, දෘෂ්ටිවාදී නොවන ප්‍රවේශය සිංගප්පූරුවේ නිර්මාතෘ ලී ක්වාන් යූ වැනි ගෝලීය නායකයින් සිහිපත් කරයි, ලී ක්වාන් වාචාලකමට වඩා ප්‍රායෝගික විසඳුම්වලට ප්‍රමුඛත්වය දුන්නේය. ජනාධිපති වික්‍රමසිංහ ශ්‍රී ලංකාවේ සංකීර්ණ දේශපාලන වටපිටාව දක්ෂ ලෙස හැසිරවීම නිසා විවිධ පාර්ශ්වකරුවන් අතර පාලම් ගොඩනැගීමේ කුසලතාවයන් ඔහුට ලබා දී ඇත. "**වැඩෙන අවිශ්වාසය නොතකා එකට වැඩ කිරීමේ නව ක්‍රම**" සඳහා ඔහුගේ දැක්ම, ක්ෂණික ජයග්‍රහණ සඳහා ආතතීන් අවුස්සන ලෝකයක බලාපොරොත්තු සහගත විකල්පයක් ඉදිරිපත් කරයි.

## වැඩිවන බෙදීම් මධ්‍යයේ එකමුතු හඬක්

වෙනත් රටවල දක්නට ලැබෙන වර්ධනය වෙමින් පවතින ජාතිකවාදයට හාත්පසින්ම වෙනස්ව, ජනාධිපති වික්‍රමසිංහ එකමුතුකමේ සහ හවුල් වගකීමේ වටිනාකම් නිරන්තරයෙන් අවධාරණය කරයි. එක්සත් ජාතීන්ගේ දේශනය අතරතුර, ප්‍රධාන බලවතුන් අතර ගැටුම් ආසියාවේ "**අපේ ප්‍රදේශයේ ආරක්ෂාවට සහ සාමයට බලපෑම් එල්ල වෙමින් පවතින බව**" ඔහු අනතුරු ඇඟවීය. මෙය ශ්‍රී ලංකාවේ




නොබැඳි ඉතිහාසය සහ කලාපීය මුහුදු සීමාව සුපිරි බල එදිරිවාදිකම්වලින් තොරව තබාග ැනීමට ඇති කැපවීම පිළිබිඹු කරන්නකි.

සාමූහික ක්‍රියාමාර්ග අවශ්‍ය වූ විට නිශ්චිතවම බෙදීම් මගින් එල්ල වන පැවැත්මේ තර්ජනය ජනාධිපති වික්‍රමසිංහ සම්පූර්ණයෙන් වටහා ගෙන තිබෙ. "**තේරීම, සාමූහික ක්‍රියාව හෝ සාමූහික සියදිවි නසා ගැනීම අතර**" බව ඔහු පැහැදිලිව ප්‍රකාශ කළේය. එය දේශගුණික විපර්යාස හෝ ණය සහන වේවා, ඔහුගේ විසඳුම් ක්‍රියාවලිය එලෙසම පවතී. සියලු දෙනාගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා රටවල් පටු ආත්මාර්ථකාමීත්වය ඉක්මවා යා යුතු බව සැලකිය යුතුවාර ගණනකදී ඔහු විසින් ඉස්මතු කර ඇත.

ඔහු පසුගියදා ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක විද්‍යාලයේ උපාධිධාරීන් අමතා කළ දේශනයෙන් ද මෙම එකමුතුකම පිළිබඳ ස්ථාවරය පැහැදිලි විය. රටේ ආරක්ෂක අවශ්‍යතා සඳහා ප්‍රායෝගික දැක්මක් පැහැදිලි කරමින් ජනාධිපති වික්‍රමසිංහගේ පුළුල් පණිවිඩය "**අපේ ප්‍රදේශයේ ආරක්ෂාව සහ සාමය**" සඳහා වූ කැපවීමකි. ලී ක්වාන් යූ මෙන්ම, ඔහු ද කල්පවතින ආරක්ෂාව රඳාපවතින්නේ අසල්වාසීන් අතර සහයෝගීතාවය මත මිස තරඟකාරිත්වය මත නොවන බව වටහාගෙන ඇත.

ජනාධිපති වික්‍රමසිංහගේ තම රට තුළ පමණක් බලය සහ නායකත්වය තහවුරු කර ගැනීමට වැඩි වශයෙන් උනන්දුවන ආසියාතික දේශපාලන ප්‍රබලයින්ට වඩා කැපී පෙනෙන වෙනසක් පෙන්වා ඇත. අභියෝග හමුවේ එකමුතුකම අවශ්‍ය වුවද පිලිපීනයේ රොද්‍රිගෝ ඩුටර්ටේ සිට ඉන්දියාවේ නරේන්ද්‍ර මෝදි දක්වා දකින්න ලැබෙන දක්ෂිණාංශික වාචාල කතා හරහා එවැනි චරිත ජනප්‍රියත්වයට පත්ව තිබේ. එහෙත් ප්‍රායෝගික විසඳුම් සහ කලාපීය සාර්ථකත්වයේ හවුල් කොටස් ප්‍රවර්ධනය කිරීම මගින් ජනාධිපති වික්‍රමසිංහ අභියෝගාත්මක කාලවලදී දූරදර්ශී රාජ්‍යත්වයේ විකල්ප ආකෘතියක් ආසියාවට ඉදිරිපත් කර ඇත.

## සංවර්ධනය සඳහා යථාර්ථවාදී මාර්ග සිතියමක්

ආසියාව සහ ශ්‍රී ලංකාව පිළිබඳ ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ දැක්ම, ගෝලීය දේශගුණික අර්බුදය හා ජෛව විවිධත්ව විනාශය සමඟ ක්‍රම කිහිපයකින් සමපාත වේ. දේශගුණික ක්‍රියාමාර්ගවල හදිසි අවශ්‍යතාවය ජනාධිපතිවරයා විසින් හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකාවේ දේශගුණික සෞභාග්‍ය සැලැස්ම හරහා පුනර්ජනනීය බලශක්තිය ඇතුළු ස්වභාවධර්මය පදනම් කරගත් විසඳුම් වේගවත් කිරීමට ප්‍රතිඥා දී ඇත. 2030 වන විට හරිතාගාර වායු විමෝචනය සියයට 14.5 කින් අඩු කිරීමටත්, පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් සියයට 70ක විදුලිය උත්පාදනය කිරීමටත්, COP 28 හි දියත් කිරීමට නියමිත ශ්‍රී ලංකාව සඳහා අභිලාෂකාමී Net Zero 2050 මාර්ග සිතියමක් ද ඔහු විසින් එළිදක්වා තිබේ. සියයට 32 වන ආවරණය, 2042 වන විට ගල් අඟුරු බලය අවසන් කිරීම ඒ අතර වැදගත් වේ. මෙම ඉලක්ක පැරිස් ගිවිසුමට සහ දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමු සම්මුතියට (UNFCCC) අනුකූල වේ.

තවද, ජනාධිපති වික්‍රමසිංහ ගෝලීය ජෛව විවිධත්වයේ තත්ත්වය පිළිබඳව දැඩි කනස්සල්ල පළ කර ඇති අතර දේශගුණික විපර්යාස, ජෛව විවිධත්වය අහිමි වීම සහ පරිසර දූෂණය යන ත්‍රිත්ව මිහිතල අර්බුදය විසඳීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයක අවශ්‍යතාවය අවධාරණය කර ඇත. වාසස්ථාන විනාශය සහ ආක්‍රමණශීලී විශේෂ හේතුවෙන් සියයට 22ක් වඳවී යාමේ අවදානමක් ඇති, දන්නා සත්ව විශේෂවලින් සියයට 8ක් මේ වන විටත් ලෝකයට අහිමි වී ඇති බවට ඔහු දැඩිව ප්‍රකාශ කර ඇත. මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා අත්‍යාවශ්‍ය Kunming-Montreal ගෝලීය විවිධත්ව රාමුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාව 2016 සිට 2022 දක්වා ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම අලුත් කිරීමේ ක්‍රියාවලියක ද යෙදී සිටී.

ලෝකයේ වඩාත්ම ජෛව විවිධත්වය සහිත කලාප නිවර්තන රටවල දක්නට ලැබෙන බව හඳුනාගනිමින් අනාගත දේශගුණික විපර්යාස අභියෝගවලට මුහුණ දීම සඳහා නිවර්තන කලාපීය රටවලට සහාය දැක්වීම සඳහා කැපවූ වැඩසටහනක් දියත් කිරීමට ද ජනාධිපති වික්‍රමසිංහ යෝජනා කර ඇත. ලෝකයේ ආවේණික ශාකවලින් සියයට 80ක් මෙන්ම සියලුම කොරල්පර සහ කඩොලානවලින් සියයට 50ක් නිවර්තන කලාපවල පිහිටා ඇති බව ඔහු අවධාරණය කර ඇති අතර මෙම සුවිශේෂී පාරිසරික සන්දර්භය ප්‍රාග්ධනය කරගනිමින් දේශගුණික විපර්යාස කෙරෙහි අවධානය යොමුකරන ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට ශ්‍රී ලංකාව ක්‍රියාකාරීව කටයුතු කරන බවත් ප්‍රකාශ කර තිබේ.

මේ අනුව දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රධානතම ප්‍රශ්නය සම්බන්ධයෙන්, ජනාධිපති වික්‍රමසිංහ සදාචාරාත්මක අධිකාරිය සහ ප්‍රායෝගික සැලසුම් යන දෙකම පෙරමුණට ගෙන එයි. අවම අහිතකර වායු විමෝචන දායකත්වයක් සහිත අවදානමට ලක්විය හැකි ජාතියක නායකයා ලෙස ඔහු ගෝලීය සහයෝගීතාව සඳහා දැඩි ලෙස පෙනී සිටියි.

එක්සත් ජාතීන්ගේ දේශනය අතරතුර, දැඩි ක්‍රියාමාර්ගයක් හරහා "**විපත වළක්වා ගැනීම**" සඳහා සාමූහික අධිෂ්ඨානය ප්‍රදර්ශනය කිරීමට ලබන වසරේදි COP 28 වැඩසටහනට අයත් රාජ්‍ය ප්‍රධානීන් කැඳවීමට ඔහු යෝජනා කළේය. අවදානමට ලක්විය හැකි ජාතීන්ට දේශගුණික මූල්‍යකරණය දෙගුණ කිරීම පිළිබඳ ඔවුන්ගේ පොරොන්දු ඉටු කිරීම සඳහා සංවර්ධිත ජාතීන් සඳහා ඔහුගෙ COP 27හි කළ ඉල්ලීම මත මෙය ගොඩනැගෙයි. ගෝලීය දකුණ සමගාමීව සංවර්ධනය කිරීමට සහ නරක අතට හැරෙන දේශගුණික බලපෑම්වලින් මෙම රාජ්‍යයන්වල පුරවැසියන් ආරක්ෂා කිරීමට සැලකිය යුතු වන්දි මුදලක් ලබා දිය යුතු බව ජනාධිපති වික්‍රමසිංහ කිහිප විටක් දැඩි ස්වරූපයෙන් යෝජනා කර ඇත.

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර දේශගුණික විපර්යාස විශ්වවිද්‍යාලයක් සඳහා වූ ඔහුගේ දැක්ම, විසඳුම් සඳහා විශේෂඥ දැනුම සහ සම්පත් බලමුළු ගැන්වීම සඳහා ආදර්ශයක් සපයයි. එය මාලදිවයින වැනි රටවල් සමඟ ඒකාබද්ධව සාක්ෂාත් කරගන්නේ නම් එය ගෝලීය දකුණේ අනාගත ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීමේ ප්‍රමුඛ මධ්‍යස්ථානයක් බවට පත්විය හැකිය. පිරිසිදු බලශක්ති අරමුණු, වන සංරක්ෂණය සහ වායු විමෝචනය අවම කිරීම පිළිබඳ ඔහුගේ ප්‍රවේශය, දෝෂාරෝපණ සහ හිස් පොරොන්දු වෙනුවට ප්‍රායෝගික මාවතක් පෙන්නුම් කරයි

## ආසියාවට අත්‍යවශ්‍ය ඒකාබද්ධ දැක්ම

බෙදුම්වාදී බලවේග නිරන්තර ආධිපත්‍යය දරන යුගයක, ජනාධිපති වික්‍රමසිංහගේ ප්‍රායෝගික කලාපීය සහයෝගීතාවය පිළිබඳ පණිවිඩය ඉතා අවශ්‍ය ප්‍රතිවිරෝධකයක් ලෙස පැමිණේ. ඔහුගේ සම්මුතිය ගොඩනැගීමේ ප්‍රවේශය සහ හවුල් වගකීම් අවධාරණය කිරීම තුළින් ඔහු ආසියානු ජාතීන්ට ඇතිවිය හැකි පැවැත්මේ තර්ජනවලට සාමූහිකව මුහුණ දීම සඳහා පටු අවශ්‍යතා ඉක්මවා යන පුළුල් රාමුවක් සපයයි.

ජනාධිපති වික්‍රමසිංහගේ දැක්ම සහ නායකත්ව විලාසය කෙටිකාලීන ජයග්‍රහණවලට වඩා එකමුතුකමට සහ විසඳුම්වලට ප්‍රමුඛත්වය දුන් අතීතයේ ප්‍රබල ආසියානු රාජ්‍ය නායකයන්ගෙන් පෙළඹවීමක් ලබාගනී. දේශගුණික විපර්යාසයේ සිට ආර්ථික කැලඹීම දක්වා වූ ගැටළු සම්බන්ධයෙන් සහයෝගීතාවයේ නව රාමු ස්ථාපිත කිරීම සඳහා ඔහුගේ කැඳවුම් වඩාත් ශක්තිමත්, වඩා ඔරොත්තු දෙන ආසියාවක් කරා මග පෙන්වයි. අනෙකුත් නායකයින් වර්තමාන හා අනාගතයේ අභියෝගවලට නැඟී සිටීම සඳහා ඔහුගේ ඉල්ලීමට අවනත වන්නේ නම් කලාපයට තුළ ඉහළ යන අභියෝග සහ ගැටුම්වලට ගොදුරුවීමට වඩා එහි විශාල විභවයන් සපුරාලීමේ අවස්ථාවක් තිබේ. අවිනිශ්චිත ලෝකයක, ආසියාව එක්සත් ඉදිරි ගමනක් සඳහා මෙම නව හඬ මගින් ලබාදෙන දැක්ම සහ ආදර්ශය සෙසු රාජ්‍යයන් විසින් සලකා බැලීම කාලෝචිත ක්‍රියාවකි. මන්දයත් වඩා යහපත් ලෝකයක් සඳහා අවශ්‍ය යෝජනා ආසියාව තුළින් මතුවිමටද හැකියව ඇති බැවිනි.

මේ අනුව ජනාධිපති රනිල් වික්‍රමසිංහ ආසියාව ගෝලීයව ඉහළ තලයට ගෙන ඒම, සවිබල ගැන්වීම සඳහා නිර්භීත දැක්මක් ප්‍රකාශ කර ඇත. දේශගුණික ක්‍රියාකාරකම්, තිරසාර වර්ධනය සහ කලාපීය සහයෝගීතාවය මෙහෙයවීම සඳහා ඔහුගේ න්‍යාය පත්‍රය කාලෝචිත මෙන්ම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, අභිලාෂකාමී දර්ශනයන් මහපොළොවේ යථාර්තයන් බවට පරිවර්තනය කිරීම තවමත් ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයක් වන අතර, මේ සඳහා දක්ෂ දේශීය ප්‍රතිසංස්කරණ සහ දක්ෂ විදේශ ප්‍රතිපත්ති උපාය මාර්ග අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ අර්බුදය ස්ථාවර වන විට, වික්‍රමසිංහ සිය උපාය මාර්ගික මාර්ග සිතියම ඉතා සූක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි සිය ශක්තීන් යොමු කරයි. ගෝලීය බලවතුන් සමඟ සබඳතා විචක්ෂණශීලීව භාවිතා කිරීමෙන්, නව බහු ධ්‍රැවීය ගෝලීය අනුපිළිවෙලක මූලාරම්භය ලෙස ආසියාව ස්ථානගත කිරීම සඳහා අවශ්‍ය පරිවර්තනයන් උත්ප්‍රේරණය කිරීමට ඔහුට හැකිය. එමෙන්ම ප්‍රායෝගික සහ දූරදර්ශී නායකත්වයක් සමඟින්, ආසියාව එහි දැවැන්ත විභවයන් මුදාහැරීමට නිසැකවම හැකියාවක් හිමිය. එහෙත් එහි පොරොන්දුව උපරිමයෙන් විවෘත කිරීම රඳාපවතින්නේ වික්‍රමසිංහ ජනාධිපතිවරයා වැනි නායකයින්ට ඔවුන්ගේ අගනා කතා, නිශ්චිත ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයකින් යුතුව ඉදිරිපත් කිරීමට හැකිවීම මත ය.

අවසාන වශයෙන්, වික්‍රමසිංහගේ මහතාගේ දැක්ම ආසියාවට පමණක් නොව ලෝකයටම ප්‍රතිලාභ සැලසෙන ගෝලීය දේශපාලනික ධ්‍රැවීකරණයට සාධනීය විකල්පයක් සපයයි. අඛණ්ඩ කලාපීය උත්සාහයන් තුළින් මෙම දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා සමඟිය අතිශයින්ම අවශ්‍ය වන තීරණාත්මක අවස්ථාව, මානව වර්ගයාගේ පොදු අභියෝග ජයගැනීම පිළිබඳ ගෝලීය සහයෝගීතාවයට ද උපකාරී වේ.

නිරෝෂන් පෙරේරා

# LGBTQ අයිතිය පිළිගත්තත් විවාහයට අවසර නෑ ඉන්දියාවේ ඉහළම උසාවිය තීරණය කරයි

LGBTQ පුද්ගලයන්ට පක්ෂග්‍රාහීත්වයෙන් හා වෙනස් කොට සැලකීමෙන් තොරවීමට ඇති අයිතිවාසිකම් පිළිගැනීම සිදුකර ඇති නමුදු ඉන්දියාවේ ඉහළම අධිකරණය සමලිංගික විවාහ නීතිගත නොකිරීමට තීරණය කර ඇත.

LGBTQ ප්‍රජාවන්ගේ නීතීඥයන් ඉන්දියානු නීතිය යටතේ විවාහ වීමේ අයිතිය ඉල්ලා සිටි අතර එමගින් විෂමලිංගික විවාහවලට සමාන නීතිමය ප්‍රතිලාභ ඔවුන් අපේක්ෂා කළේය. ඉන්දියාවේ අගවිනිසුරුවරයාගේ නායකත්වයෙන් යුත් විනිසුරුවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත විනිසුරු මඩුල්ලක් විසින්, මෙම අයිතිය ප්‍රතික්ෂේප කරමින් තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී. මෙම තීරණය රට පුරා සජීවීව විකාශය කරන ලද අතර උසාවියෙන් පිටත රැස්ව සිටි ජනතාව විසින් නරඹන ලදී.

පැය දෙකක නඩු තීන්දුවේදී අගවිනිසුරු ඩී.වයි. චන්ද්‍ර රචූඩ් අවධාරණය කළේ සමලිංගික වීම ජීවිතයේ ස්වභාවික අංගයක් බවත්, ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය හෝ ලිංගික දිශානතිය මත පදනම්ව සමලිංගික ප්‍රජාවට එරෙහිව වෙනස් කොට සැලකීම වළක්වන ලෙසත්ය.

LGBTQ යුවළයන්ට තම හවුල්කරුවන් තෝරා ගැනීමට සහ සමාජය තුළ ඔවුන් තෝරා ගන්නා ඕනෑම ආකාරයකින් ඔවුන්ගේ කැපවීම සැමරීමට අයිතියක් ඇති බව විනිසුරු එස්. රවීන්ද්‍ර භාත් අවධාරණය කළේය. කෙසේ වෙතත්, ඔහු පැහැදිලි කළේ මෙය ඔවුන්ගේ විවාහ සඳහා නීතිමය පිළිගැනීමක් ලබා නොදෙන බවයි.



LGBTQ යුවළයන්ට වන්දි ප්‍රතිලාභ සහ නීත්‍යනුකූල විවාහ සමඟ ලැබෙන සමාජ සුභසාධන හිමිකම් ප්‍රතික්ෂේප කිරීමෙන් වක්‍රාකාරයෙන් වෙනස් කොට සලකන නීති තක්සේරු කිරීම සඳහා කමිටුවක් පිහිටුවීමට ද භාත් යෝජනා කළේය.

ඉන්දියාවේ විවාහ නීති, LGBTQ යුවළකට ළමයකු දරුකමට හදාගැනීම, රක්ෂණය සහ උරුමය වැනි ගැටළුවලට අදාළ නීතිමය ප්‍රතිලාභවලට ප්‍රවේශ වීම වළක්වයි.

පෙත්සම්කරුවන් විශාල සංඛ්‍යාවක් මෙම නීතිය අභියෝගයට ලක් කරමින් අප්‍රේල් සහ මැයි මාසවල පැවති නඩු විභාගයේදී ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු ඉදිරිපත් කර තිබුණි.

පෙත්සම්කාරියක වන සුසාන් ඩයස් මෙම නඩු තීන්දුව සම්බන්ධයෙන් කලකිරීම පළ කරමින් කියා සිටියේ වඩාත් සාධනීය ප්‍රතිඵලයක් තමා අපේක්ෂා කළ බවයි.

පාලක පක්ෂය වන භාරතීය ජනතා පක්ෂය සමලිංගික විවාහ නීතිගත කිරීමට විරුද්ධ විය. අධිකරණයට කරුණු ඉදිරිපත් කරමින් රජයේ නීතීඥවරයා කියා සිටියේ සමලිංගික විවාහ යනු රටේ සමාජ වටිනාකම්වලට අනුකූල නොවන නාගරික හා ප්‍රභූවාදී සංකල්පයක් බවයි.

මෙම නඩු තීන්දුව LGBTQ ක්‍රියාකාරීන් අතර මිශ්‍ර ප්‍රතිචාර ඇති කළේය. සමහරු එය ප්‍රගතිශීලී පියවරක් ලෙස දුටු අතර, තවත් සමහරුන්ට එය ඔවුන්ගේ අපේක්ෂාවන්ට වඩා අඩු වූ බව හැඟී ගියේය. ධනාත්මක අංශ කෙරෙහි අවධානය යොමු කිරීමේ සහ LGBTQ අයිතිවාසිකම් සඳහා අඛණ්ඩව සහයෝගය දැක්වීමේ අවශ්‍යතාව ඔවුන් අවධාරණය කළහ.

ඉන්දියාවේ විශාල LGBTQ ප්‍රජාවක් සිටින අතර සමලිංගික අභිමානය සැමරුම් විවිධ නගරවල සිදු වේ. කෙසේ වෙතත්, සමලිංගික සබඳතා පිළිබඳ ආකල්ප සංකීර්ණ වී ඇත.

හින්දු මිථ්‍යා කථාවල විවිධ ස්ත්‍රී පුරුෂ අනන්‍යතා පිළිබඳ ඓතිහාසික සඳහනක් ඇතත්, 1860 දී බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ හඳුන්වා දුන් දණ්ඩ නීති සංග්‍රහයක් යටතේ සමලිංගික සබඳතා සාපරාධී කරණය කරන ලද අතර විවාහ අයිතිවාසිකම් විෂමලිංගික යුවළයන්ට පමණක් සීමා විය.

මෑත වසරවලදී, සමලිංගිකත්වය සම්බන්ධයෙන් වන නීතිවල වෙනස්කම් ඉන්දියාවේ දක්නට ලැබුණ අතර 2018 දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යටත් විජිත යුගයේ සමලිංගික සංසර්ගය සාපරාධී කරණය කිරීමේ නීතිය අවලංගු කරන ලද නමුත් විෂමලිංගික යුවළයන් සමඟ විවාහවීමේ සීමාව රඳවා ගත්තේය.

සමීක්ෂණවලින් පෙන්නුම් කරන්නේ ඉන්දියාවේ සමලිංගිකත්වය පිළිබඳ පිළිගැනීම වර්ධනය වන බවයි. මෙම ප්‍රගතිය තිබියදීත්, සමලිංගික හැසිරීම්වලට විරුද්ධ ගතානුගතික හඬවල් තවමත් පවතී, විවාහය ප්‍රජනනය සඳහා මිස විනෝදාස්වාදය සඳහා නොවන බව ඔවුන් තර්ක කරයි.

නිරෝෂන් පෙරේරා

# චීනය ප්‍රහාර එල්ල කළහොත් පිලිපීනයට උදව්කරනවා - බයිඩන්

පිලිපීනයේ සහ චීනයේ බෝට්ටු දෙකක් මතභේදයට තුඩු දී ඇති දකුණු චීන මුහුදු සීමාවේදී ගැටීමෙන් අනතුරුව ඇතිව තිබෙන රාජ්‍ය තාන්ත්‍රික ගැටළුව මධ්‍යයේ දකුණු චීන මුහුදේදී පිලිපීන නාවික යාත්‍රාවලට චීනය පහර දුනහොත් ඇමරිකාව පිලිපීනය ආරක්ෂා කරන බව ඇමරිකානු ජනාධිපති ජෝ බයිඩන් පවසා ඇත.

ඔවුන් ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජනපදයේ කැපවීම ගැන බයිඩන් පිලිපීනයට දැඩි ලෙස සහතික විය. පිලිපීනය මෙම මුහුදු තීරයේ චීනයේ හිමිකම්වලට අභියෝග කරමින් සිටින්නේ චීනය මෙම සීමාවේ සිදුකරන අනාරක්ෂිත ක්‍රියාවන්වලට එරෙහිවය.

බයිඩන් මාධ්‍යට අදහස් දක්වමින් පැවසුවේ, **"මට පැහැදිලිව ප්‍රකාශ කිරිමට අවශ්‍යයි පිලිපීනය ආරක්ෂා කිරීමට එක්සත් ජනපදයේ පොරොන්දුව ශක්තිමත්, එක්සත් ජනපදය සහ පිලිපීනය අතර ආරක්ෂක ගිවිසුම ස්ථිරයි"** යනුවෙනි.

1951 දී ඇති කරගත් මෙම ගිවිසුමෙන් අදහස් වන්නේ ප්‍රහාරයක් එල්ල වුවහොත් එක්සත් ජනපදය සහ පිලිපීනය එකිනෙකා ආරක්ෂා කිරීමට කැපවී සිටින බවයි.

**"පිලිපීන ගුවන්යානා, නැව් හෝ මිලිටරිවලට එල්ල වන ඕනෑම ප්‍රහාරයක් පිලිපීනය සමඟ අපගේ ආරක්ෂක ගිවිසුම සක්‍රීය කරනු ඇත"** යනුවෙන් බයිඩන් වැඩිදුරටත් පැවසීය.

පිලිපීනය කියා සිටියේ චීනයේ ක්‍රියාකලාපය හේතුවෙන් චීන වෙරළාරක්ෂක නෞකාවක් සහ පිලිපීන සැපයුම් බෝට්ටුවක් පිලිපීනයට අයත් ප්‍රදේශයක දී ගැටීමක් සිදුව ඇති බවයි. තවත් සිදුවීමක දී පිලිපීනය පැවසුවේ චීන මිලීෂියා බෝට්ටුවක් පිලිපීන වෙරළාරක්ෂක යාත්‍රාවක ගැටී ඇති බවයි.






චීනය සහ පිලිපීනය අතර ආතතිය මෑතකදී වර්ධනය වීමෙන් පසු ඇමරිකානු ජනාධිපතිවරයාගේ ප්‍රකාශය ඔහුගේ වඩාත්ම බලගතු ප්‍රකාශය ලෙස විශ්ලේෂකයන් පෙන්වා දෙයි.

මෙම ගැටුම සිදුවූයේ පිලිපීන බෝට්ටු ඔවුන්ගේ භෞමික හිමිකම් සනාථ කිරීම සඳහා පිලිපීනය දෙවන තෝමස් ෂෝල්හි ස්ථානගත කර තිබූ නාවික හමුදා නෞකාවකට සහය වීමට යමින් සිටියදීය.

පිලිපීනයේ ආරක්ෂක අමාත්‍ය ගිල්බර්ටෝ ටියෝඩෝරෝ ජූනියර් චෝදනා කළේ චීනය හිතාමතාම තම යාත්‍රාවලට පහර දෙන බවත්, ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා සත්‍යය විකෘති කරන බවත්ය.

බයිඩන් මෙම ප්‍රකාශයන්ට එකඟ වූ අතර, චීන බෝට්ටු ගැටුම්වලදී භයානක හා නීති විරෝධී ලෙස හැසිරුණු බව පැවසීය.

පිලිපීනය එක්සත් ජනපදයේ වැදගත් මිතුරෙකු වන්නේ එය පැසිෆික් කලාපයේ ගැටුම් සහිත ප්‍රදේශ දෙකක් වන දකුණු චීන මුහුද සහ තායිවානය අසල පිහිටා ඇති බැවිනි.

ජනාධිපති ෆර්ඩිනන්ඩ් මාකෝස් ජූනියර් 2022 ජූනි මාසයේදී බලයට පත් වූ දා සිට එක්සත් ජනපදය සමඟ පිලිපීනයේ සන්ධානය ශක්තිමත් කළේය. මේ අනුව පිලිපීන බලධාරීන් දකුණු චීන මුහුදේ චීනයේ ක්‍රියාමාර්ග අභියෝගයට ලක් කිරීම සඳහා වඩාත් යොමු වී ඇතැයි පෙනීමට තිබේ.

මාකෝස් සිය පූර්වගාමියා වූ රොඩ්රිගෝ ඩුටර්ටේට වඩා වෙනස් ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර, දකුණු චීන මුහුදේ චීනයේ මුරණ්ඩුකමට එරෙහිව සටන් කිරීමට ප්‍රමාණවත් පියවර නොගැනීම නිසා විවේචනයට ලක් විය. දකුණු චීන මුහුදේ චීනයේ පුළුල් හිමිකම්වලට කිසිදු පදනමක් නොමැති බව ප්‍රකාශ කළ ජාත්‍යන්තර විනිශ්චය සභාවකදී චීනයට එරෙහිව පිලිපිනයේ නීතිමය ජයග්‍රහණය ඩුටර්ටේ රටට වාසි වන ලෙස භාවිතා කළේ නැති බව බොහෝ දෙනාගේ මතයයි.

නිරෝෂන් පෙරේරා

# ආණ්ඩුව ඇයි මෙහෙම?




බලයේ සිටින පක්ෂයක්, ඒ කියන්නේ ආණ්ඩුවක් සාමාන්‍යයෙන් තමන්ගේ පාලන කාලය තුළ මොනවා කෙරුවා කිව්වා වුණත් අවසාන කාලය වෙන කොට හැසිරෙන්නේ වෙනස් විදිහකට. ඒ කියන්නේ මැතිවරණය ළං වෙනකොට ජනතාවාදී වෙනවා. ඒක සාමාන්‍යයෙන් මේ රටේ පැවැතුණ ස්වභාවය. මේ කාලේදි කරන්නේ පුළුවන් තරම් දේවල් මිනිස්සුන්ට බෙදන එක. මේක ආණ්ඩු පක්ෂයෙන් විතරක් නෙවෙයි, විපක්ෂයේ දේශපාලන පක්ෂ කණ්ඩායම්වලිනුත් වෙන දෙයක්. එයාලත් පුළුපුළුවන් විදිහට බෙදනවා. ආණ්ඩුවක් නම් මැතිවරණ අය-වැයක් එහෙමත් ගේනවා. රාජ්‍ය සහනාධාර, රාජ්‍ය රැකියා තොග පිටින් බෙදනවා. බදු අඩුකරනවා, බඩු මිල අඩුකරනවා වගේ ජනප්‍රිය තීන්දු ගන්නවා.

කප්පරක් පොරොන්දු එක්ක තමන්ට අතපතගාන්න පුළුවන් දේවල් ලැබෙනකොට, කන්න බොන්න දේවල් ලැබෙනකොට, ඒ දෙන කෙනාට ඡන්දය පාවිච්චි කිරීම වෙනවා. මේක දේශපාලකයන් හොඳටම දන්නවා අත්දැකීමෙන්ම.

දේශපාලනයේදි ප්‍රතිපත්ති වැඩපිළිවෙලවල්, තීන්දු තීරණ ගැන කොයිතරම් වාද විවාද තිබුණත් මැතිවරණයකදී මිනිස්සුට එච්චා එච්චරටම වැදගත් වෙන්නේ නැහැ. ප්‍රතිපත්ති ගැන වද වෙන මිනිස්සු නැතුව නෙවෙයි, එහෙම කොටසක් ඉන්නවා දේශපාලනිකව හිතන. නමුත් බහුතරය දේවල් තීරණය කරන්නේ එයාලට බොහොම ළඟ දේවල් එක්ක. බඩු බෙදිල්ල වගේම තමන්ට තියෙන නැදැහිතවත්කම ජාතිය ආගම කුලය බලපානවා. ජනප්‍රිය ප්‍රතිරූපවලටත් මිනිස්සු කැමතියි. මිනිස්සු එහෙම වෙන්නේ දේශපාලනය කියලා එයාල දන්න දේවල් එක්ක. ගොඩක් දෙනෙකු දේශපාලනය කියන්නේ, දේශපාලන පක්ෂයක සක්‍රිය සාමාජිකයකු වීම, මැතිවරණයකට ඉදිරිපත් වීම, මන්ත්‍රී කෙනෙක් ඇමති කෙනෙක් කෙනෙකු වීම වගේ දේවල්. මේ දේවල් එක්ක තමන්ට කවුද මොනවද දෙන්නේ කියන එක අනුව දේශපාලන තීන්දුවක් ලෙස කතිරය ගැසීම කරනවා. දේශපාලකයෙන් පොරොන්දුවක් දීලා ඒක නොලැබුණාම අනෙක් පැත්තට වැඩ කිරීම මේ අය ගන්න බරපතලම දේශපාලන තීන්දුවක් වෙනවා.

ගොඩක්ම මිනිස්සුන්ට දේශපාලන තීන්දු ගන්න ඕන වෙන්නේ සරල ප්‍රශ්න. සංකීර්ණ ප්‍රශ්න අත් හරිනවා. මිනිස්සු අතර ජනප්‍රිය වෙන්න නම් සරළ ප්‍රශ්නවලට සරළ උත්තර තමයි දෙන්න ඕන. මේ දේශපාලනය වෙනස් වෙන්න ගන්නේ ඉතාම අඩු කාලයක්.

ඉතිං මෙහෙම බහුතරයක් එක්ක මේ රටේ දේශපාලනය කරන එක සරළ පහසු දෙයක්. ඕන හොරෙකුට ජාවාරම්කාරයකුට පිස්සෙකුට වුණත් සල්ලි ටිකක් විසිකරමින් මේක පහසුවෙන් කරන්න පුළුවන්. හොඳ කයිවාරුකාරයකුට වුණත් ලස්සන වචන ඇදබාමින් බොරු කියමින් මේ දේශපාලනය කරන්න පුළුවන්. මේ දවස්වල වුණත් මේ කියන දේශපාලනය රටේ වෙනවා දකින්න පුළුවන්. ජනප්‍රිය දේශපාලනය වෙන්නේ මේක.

නමුත් මේ ජනප්‍රිය දේශපාලනය වෙනුවට ජනප්‍රිය නොවන දේශපාලනයකුත් රටේ තියෙනවා. ඇත්ත දේශපාලනය වෙන්නේ මේක. රටක් ජනතාවක් වෙනස් කිරීම තමයි වැඩේ වෙන්නේ. මේක අමාරු වැඩක්. ප්‍රතිපත්ති එක්ක දේශපාලනය තෝරමින් තීන්දු ගන්න එක ජනප්‍රිය නැහැ. මොකද මේකෙදි බෙදන්න දේවල් නැහැ, මිනිස්සුන්ට ළඟ ළඟ මොකුත් ලැබෙන්නේ නැහැ. සමහර විට මිනිස්සු දුෂ්කරතාවයට පත් වෙන්නත් පුළුවන් මේ වැඩවලින්. ආණ්ඩුවක් දේශපාලනය කරද්දි ප්‍රතිපත්ති එක්ක වැඩ කරනවා කියන්නේ අතුරේ යනවා වගේ වැඩක්. පරණ ප්‍රතිපත්ති වෙනුවට අලුත් දෙයක් යෝජනා කරන එකත් බරපතල විරෝධයන්ට ලක්වෙන්නත් පුළුවන්. ඒකත් මැතිවරණය උණුසුමක් පැතිරෙමින් තියෙන වෙලාවක වෙනවා කියන්නේ ලුණු කැඩිච්ච අතුරක යෑමක්.

කොහොම වුණත් ලබන අවුරුද්ද මැතිවරණ කාලයක් වීමේ ලකුණු පහළ වෙලා තියෙන්නේ. සාමාන්‍යයෙන් දේශපාලන පක්ෂ මැතිවරණ ආසනන්යේ තමයි සක්‍රීය වෙන්නේ. නමුත් පහුගිය වසරක දෙකක් කාලය බැලුවොත් විශේෂයෙන්ම විපක්ෂයේ ප්‍රධාන පක්ෂ අඛන්ඩවම වගේ දිනපතා මහජන රැළි, උද්ඝෝෂණ ආදිය පවත්වමින් විශාල දේශපාලන කතිකාවක් නිර්මාණය කරමින් යනවා. ඒවාට ජන සහභාගිත්වයකුත් තියෙනවා. ඒක හොඳයි. පහුගිය කාලේ වෙච්ච දේවල් එක්ක මිනිස්සු පක්ෂ දේශපාලනය පිළිකුල් කරලා ඒකෙන් අයින් ගහල හිටියේ, 225ම එපා කියන තැන. නමුත් ඒක දැන් වෙනස් වෙලා. ආණ්ඩුවේ සහ විපක්ෂයේ ක්‍රියාකාරිත්වය මිනිසුන්ගේ පසුගාමී බව වෙනස් කරලා. නමුත් මිනිස්සු මේකේ සක්‍රීය වෙන්න ඕන දේශපාලනිකව හිතන්න තීන්දුගන්න පුළුවන් වෙන තැන දක්වාම. ප්‍රතිපත්ති දේශපාලනය ගැන වාදයක් වෙන්න ඕන. අතට ලැබෙන දේ, කටට දාගන්න ලැබෙන දේ ගැන නෙවෙයි. පක්ෂය, පුද්ගල ප්‍රතිරූපය, ජාතිය, ආගම, කුලය ගැන නෙවෙයි.

මේ අස්සේ අද ජනාධිපති රනිල් කරමින් ඉන්නේ වෙනස් දේශපාලනයක්. ආණ්ඩුව තමන්ගේ ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති තීන්දු තීරණ සෘජුව ගනිමින් වැඩ කරනවා. ජනප්‍රිය වැඩ ආණ්ඩුවෙන් ප්‍රදර්ශනය වෙන්නේ නැහැ මැතිවරණ උණුසුමක් දැනෙමින් තිබුණත්. මේක වෙනස් තත්වයක්.

පක්ෂ දේශපාලන කෝණයෙන් බැලුවාම ආණ්ඩුව මේ වෙලාවේ ජනප්‍රිය නැහැ. ජනප්‍රිය වෙන්න හදන්නෙත් නැහැ. ඒත් එයාලගේ වැඩේ කරනවා. තව කෙටි කාලයක් තියෙන්නේ මැතිවරණ වලට. මේ කාලයේදී ජනමතය දිනාගන්න ආණ්ඩුවට බැරිවෙයි කියල විපක්ෂය වගේම බොහෝ මිනිස්සුත් දැන් හිතනවා වෙන්න පුළුවන්. ඒත් ආණ්ඩුවේ ප්‍රතිපත්ති තීන්දුවල ප්‍රතිලාභ තියෙන්නේ තව ඉස්සරහට. එතකොට දේශපාලනය වෙනස් වෙන්න ගන්නේ ඉතාම අඩු කාලයක්.

ලොකු










පිටකෝට්ටේ, මිෂන් පාර, අංක 19/5/ඒ දරණ ස්ථානයේ පදිංචි කේ.පී.අයි. ප්‍රියංගනී වන මා විසින් උඩහමුල්ල, විජේරාම මාවගේ පිහිටි TDL මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී